# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2417/32 - 2025 ජනවාරි මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2025.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/04/2021/16.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.22 දිනැති හා අංක 2320/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.02.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, රාගම, මහර නුගේගොඩ, අංක 237 හි පදිංචි ඒ. කේ. ඩී. ජී. අතුකෝරල මහතා සහ කොළඹ 15, මට්ටක්කුලිය, කාක දූපත, අංක 15 හි පිහිටි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/28/2023 හා 2024.12.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 දෙසැම්බර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A - G 043398 - 18 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

ඒ. කේ. ඩී. ජී. අතුකෝරල මයා,
අංක 237,
මහර නුගේගොඩ,
රාගම.
*(පළමු පාර්ශ්වය)*

නඩු අංකය: A/28/2023
IR/COM/04/2021/16

සහ

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,
අංක 15,
කාක දූපත,
මට්ටක්කුලිය,
කොළඹ 15.
*(දෙවන පාර්ශ්වය)*

කම්කරු හා විදේශීය රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර අමාත්‍යවරයා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2023.02.17 වන දින බේරුම්කරු වශයෙන් එම්. එම්. අයි. ආර්. ජයතිලක වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත්කර ඇත.

"2002.10.15 දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ගණකාධිකාරි ලෙස සේවය කරමින් සිටියදී 2023.10.01 වන දින පැවති අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුර සඳහා බඳවා ගැනීමේදී අසාධාරණයක් සිදුව තිබේද යන්නත් ඒ හේතුවෙන් එම ආයතනය 2015.06.17 වන දින සිට ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය බවට පත්වූ පසු එහි අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර හිමි නොවීමෙන් අසාධාරණයක් සිදු ව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද? කවදා සිටද? යන්නත් පිළිබඳව වේ."

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය අනුව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් පනවන ලද නියෝග අංක 21(1) හා 21(2) මගින් දක්වා ඇති පරිදි ආරාවුලට විෂය වී ඇති සම්පූර්ණ කරුණු සම්බන්ධයෙන් වූ විස්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වයෙන් ම ලබා ගතිමි. අනතුරුව ප්‍රතිවිරුද්ධ පාර්ශ්ව වෙතින් ලද විස්තර ප්‍රකාශවලට පිළිතුරු ලෙස වූ ප්‍රති උත්තර ප්‍රකාශයන් දෙපාර්ශ්වය වෙතින් වෙන වෙනම ලබාගතිමි.

2023.03.22 දින දෙපාර්ශ්වය කැඳවා බේරුම්කරණ කටයුතු ආරම්භ කිරීමට තීරණය කළෙමි. එදින දෙවන පාර්ශ්වය වෙනුවෙන් කිසිවෙකු පෙනී නොසිටි අතර ඊට හේතු දැක්වීමක් ද කර නැත. පළමු පාර්ශ්වය පමණක් පෙනී සිට ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව තමාගේ පළමු ලිඛිත ප්‍රකාශය ඉදිරිපත් කර සිටී. දෙවන පාර්ශ්වය වෙත මීළඟ දිනට පැමිණීම සඳහා ලියාපදිංචි තැපැල් මගින් කැඳවීම් කිරීමට නියම කළෙමි. ඊට අමතරව පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ආරාවුලට හේතුවී ඇති කරුණු පිළිබඳව පළමු විස්තර ප්‍රකාශයේ පිටපතක් දෙවන පාර්ශ්වය වෙත ලියාපදිංචි තැපැල් මගින් යැවීමට ද නියම කළෙමි. 2023.04.03 වන දින දෙපාර්ශ්වයට නැවත පෙනී සිටින ලෙස නියම කරන ලද අතර එදිනට පළමු පාර්ශ්වයේ මූලික සාක්ෂි විභාගයට සූදානම් ව පැමිණෙන ලෙස ද දැන්වීමි.

2023.04.03 වන දින දෙපාර්ශ්වය පැමිණ සිටි නමුත් දෙවන පාර්ශ්වය පැය භාගයක් පමණ ප්‍රමාද වී පැමිණි හෙයින් එවැනි ප්‍රමාදයන් මින් ඉදිරියේදී නොකිරීමට වගබලාගන්නා ලෙසට අවවාද කරන ලද අතර දෙවන පාර්ශ්වය විසින් අද දින ද ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව වූ තම පළමු විස්තර ප්‍රකාශය ඉදිරිපත් නොකරන ලදී. එබැවින් අද දින ද සාක්ෂි විභාග කිරීම ආරම්භ නොකරන ලද අතර දෙවන පාර්ශ්වයේ විස්තර ප්‍රකාශය 2023.04.20 වන දිනට කාර්යාලයට ඉදිරිපත් කරන ලෙසත් 2024.04.28 වන දිනට දෙපාර්ශ්වය විසින්ම ප්‍රතිඋත්තර ප්‍රකාශයන් ඉදිරිපත් කරන ලෙසත් නියම කළෙමි. තව ද එදිනට පළමු පාර්ශ්වයේ සාක්ෂි විභාගය ආරම්භ කිරීමට ද තීරණය කළෙමි.

ඒ අනුව 2023.04.28 දින දෙපාර්ශ්වය සමග සාකච්ඡා කිරීමේ දී ඔවුන් අතර සමථකරණයක් සඳහා කිසිදු එකඟතාවයක් නොමැති බැවින් පළමු පාර්ශ්වයේ සාක්ෂි විභාගය ආරම්භ කිරීමට කටයුතු කළෙමි.

ඉන් පසු 2023.04.08 දින සිට 2024.04.29 දින දක්වා දෙපාර්ශ්වයේ සාක්ෂි විභාග කිරීම සිදු කළෙමි. අවසානයේ පළමු පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදීම සඳහා කැඳවනු ලැබූ සාගර විශ්වවිද්‍යාලයේ හිටපු කුලපති තිලක් ධර්මරත්න මහතා සාක්ෂි දීමෙන් පසුව ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට 2024.04.29 දිනට නියමව තිබූ නමුත් එදිනට ඔහු පැමිණ නොසිටිය අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා ද පැමිණ නොසිටියේය. පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් වාචිකව දන්වා සිටියේ තම නියෝජිත මහතාට පොඩි කැස්සක් වගේ අසනීපයක් ඇති බැවින් සාක්ෂිකරුට ද එදිනට නොපැමිණෙන ලෙසට දැන්වූ බවයි.

එදින වන විටත් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දීර්ඝ සාක්ෂි විභාගයක් පවත්වා ඇති බවත් එදින පළමු පාර්ශ්වයේ නොපැමිණීම සම්බන්ධයෙන් පිළිගතහැකි වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් තොරව හිතුමනාපයට කටයුතු කර දින ලබාගැනීම සඳහා ක්‍රියා කිරීමට ඉඩදිය නොහැකි බව දන්වන ලද අතර 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය මගින් පනවා ඇති නියෝග අංක 28 ප්‍රකාරව අද දිනට නියමිත සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමකින් තොරව දෙපාර්ශ්වයේ එකඟත්වය මත නඩුවේ වෙනත් සාක්ෂි නොමැති බැවින් සාක්ෂි විභාගය අවසන් කර 2024.05.28 දිනට ලිඛිත දේශන ඉදිරිපත් කරන ලෙස නියම කළෙමි.

කාර්මික ආරාවුල් පනත යටතේ පනවන ලද නියෝග අංක 21(1) සහ 21(2) අනුව ආරාවුල ඇතිවීමට හේතු වූ කාරණා පිළිබඳව දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ හා ප්‍රතිඋත්තර ප්‍රකාශයන් ද ඉදිරිපත් වූ ලිඛිත හා වාචික සාක්ෂි ද විශ්ලේෂණය කර සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීමට කටයුතු කළෙමි.

**සාක්ෂි විශ්ලේෂණය**

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර A. K. D. G. අතුකෝරළ යන අය 2002.10.15 වන දින සිට 1999 අංක 36 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කර ඇති ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ගණකාධිකාරිවරයෙකු ලෙස පත්වී ඇත. ඔහු ඊට පෙර විවිධ ආයතනවල අවුරුදු 17 ක පමණ කාලයක් සේවය කර දීර්ඝ සේවා පළපුරුද්දක් ලබා ඇත. ඔහු වානිජවේදී (විශේෂ)

උපාධිධරයෙකු වන අතර වරලත් ගණකාධිකරණ ආයතනයේ Intermediate සහතික පත්‍ර ලාභියෙකි.

එවකට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ පුරප්පාඩු වී පැවති අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුරට සුදුස්සෙකු බඳවාගැනීම සඳහා එම ආයතනයේ පැවති බඳවාගැනීමේ පටිපාටියට අනුව 2003.07.14 වන දින DAILY NEWS පුවත්පතේ පළකරන ලද පුවත්පත් දැන්වීමක් මගින් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත. A. K. D. G. අතුකෝරල මහතා ද ඒ සඳහා අයදුම්කර ඇති අතර ඔහු ද සමග අයදුම්කරුවන් 8 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා 2003.10.01 දිනට කැඳවා ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගි වී ඇත.

1. සභාපති, ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය
2. සහකාර අධ්‍යක්ෂක, INSTITUTE OF PUBLIC ENTERPRISES මහා භාණ්ඩාගාරය
3. සහකාර අධ්‍යක්ෂක (මුදල්) ධීවර අමාත්‍යාංශය

සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනට පසු දින A. K. D. G. අතුකෝරල මහතාට සහ එම ආයතනයේම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරමින් සිටි සහ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවෙකු වන මේජර් පී. එස්. ජේ. රත්නායක මහතාට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයාගේ නිල කාමරයට පැමිණ ඔහු හමුවන ලෙස සභාපතිවරයා විසින් දන්වා ඇත. ඒ අනුව ඔවුන් දෙදෙනාම සභාපතිවරයාගේ නිල කාමරයට ගොස් ඔහු හමුවී ඇත. එහිදී සභාපතිවරයා විසින් පෙර දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ට ලකුණු ලබා දී ඇති ලේඛනය පෙන්වා පහත සඳහන් කරුණු පිළිබඳව තමන් දැනුවත් කරන ලද බව සාක්ෂි විභාගයේදී A. K. D. G. අතුකෝරල මහතා විසින් අවධාරණය කරමින් කියා සිටී.

1. සම්මුඛ පරීක්ෂණයේදී A. K. D. G. අතුකෝරල මහතා ඉහළම ලකුණු ලබා තේරී ඇති බව
2. දෙවන ස්ථානයට මේජර් පී. එස්. ජේ. රත්නායක මහතා ලකුණු ලබාගෙන ඇති බව
3. නමුත් පී. එස්. ජේ. රත්නායක මහතා මෙම තනතුරට පත්කළ යුතු බවට, එවකට සිටි ධීවර ඇමතිවරයා විසින් තමන්ට දන්වා සිටි බව
4. ඒ අනුව කෙටි කලකට පී. එස්. ජේ. රත්නායක මහතා මෙම තනතුරට පත් කිරීමට එකඟවන ලෙස A. K. D. G. අතුකෝරල මහතාට සභාපතිවරයා විසින් දැන්වීමට තීරණය කළ බව

එහිදී පී. එස්. ජේ. රත්නායක මහතා විසින් පවසා ඇත්තේ තමන්ට වෙනත් රැකියාවක් සඳහා යාමට ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක සිටීම ප්‍රබල සුදුසුකමක් නොවන බැවින් කෙටි කලකට තමන්ට මෙම පත්වීම ලබාගැනීමට අවස්ථාව දෙන ලෙසයි. සාකච්ඡාව අවසානයේ පී. එස්. ජේ. රත්නායක මහතා සහ A. K. D. G. අතුකෝරල මහතා සභාපතිවරයා සමග එකඟ වී ඇත්තේ මාස 03ක කෙටි කාලයක් සඳහා අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුර පී. එස්. ජේ. රත්නායක මහතා විසින් ලබාගෙන මාස 03කින් පසු ආයතනයෙන් අස්වී යන බවත් අනතුරුව A. K. D. G. අතුකෝරල මහතාට එම තනතුර සභාපතිවරයා විසින් ලබාදෙන බවත්ය. එම අවස්ථාවේදී ම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇති ලේඛනයේ ඇති ලකුණු සභාපතිවරයා විසින් තමන් ඉදිරියේදීම වෙනස් කර පී. එස්. ජේ. රත්නායක මහතා විසින් වැඩි ලකුණු ලබාගත් ලෙසට එම ලේඛනය වෙනස්කර ඇත. එම ලකුණු වෙනස් කිරීම වෙනුවෙන් සහ තමන්ට හිමි තනතුර කෙටි කලකට වෙනත් අයෙකුට ලබාදීම පිළිබඳව A. K. D. G. අතුකෝරල මහතා එකඟ වූ බව ද සාක්ෂි විභාගයේදී ඔහු විසින් පැහැදිළිව ප්‍රකාශ කර සිටී.

ප්‍ර - එතකොට සාක්ෂිකරු ඔබ ඔබේ මූලික සාක්ෂියේදී කියනවා ඔබේ කැමැත්ත සභාපතිතුමා විසින් විමසීමක් කළා කියලා එහෙම නේද?

පි - එහෙමයි

ප්‍ර - ඒ වගේම තමයි සාක්ෂිකරු දැන් කිව්වා තමන් මෙම තනතුර ලබාදීම සම්බන්ධයෙන් තමා විරුද්ධ නොවන බව ප්‍රකාශ කලා කියලා

පි - එහෙමයි ස්වාමිනි

ප්‍ර - ඒ අනුව තමයි ඔබගේ තවදුරටත් මූලික සාක්ෂියේ තිබෙනවා මේජර් රත්නායක මහතාට මේ කියන 2003 සම්මුඛ පරීක්ෂණයෙන් අධ්‍යක්ෂක (පාලන හා මූල්‍ය) තනතුර ලබාදෙනු ලැබුවේ කියලා. ඔබේ සාක්ෂියෙන්ම පිළිඅරගෙන තියනවා නේද?

පි - එහෙමයි ස්වාමීනි

(2023.06.28 සාක්ෂි සටහන් පිටු අංක 24)

එසේ එකඟවීමට හේතුව ලෙස ඔහු කියා සිටින්නේ ඇමතිවරයාගේ මැදිහත්වීම නිසා ඊට එරෙහිවීමට තමන් බියවූ බවකි. ඇමතිවරයාගේ ඉල්ලීමට එකඟ නොවූයේ නම් තමන්ගේ රැකියාව අහිමිකරනු ඇතැයි තමන් බියවූ බව ද සාක්ෂි විභාගයේදී අතුකෝරල මහතා කියා සිටී. අතුකෝරල මහතාගේ මෙම ප්‍රකාශය තහවුරු කිරීමට කිසිදු වාචික හෝ ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ඔහු අසමත් වී ඇති බවද නිරීක්ෂණය වේ.

ප්‍ර - ඔය කියන සිද්ධිය සම්බන්ධයෙනුත් ඔබ මේ ගරු අධිකරණයට කිසියම් ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කරලා තියනවද?

පි - ඒ ප්‍රකාශයන් සභාපතිතුමා විසින් අප දෙදෙනා ඉදිරියේ දී කරන ලද ප්‍රකාශයක්

ප්‍ර - මේ ප්‍රකාශ සම්බන්ධයෙන් කිසිම පිළිගත හැකි සාක්ෂියක් අද වනතුරුත් ඔබ ඉදිරිපත් කරලා නැහැ නේද?

පි - නැත

(2023.06.28 දින සාක්ෂි සටහන් පිටු අංක 22)

ඒ අනුව මේජර් පී. එස්. ජේ. රත්නායක මහතාට 2003.10.27 දින සිට අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුර ලබා දී ඇති අතර ඔහු 2004.02.07 දින පාර්ලිමේන්තුව විසුරුවා හරින විටත් සේවය කරමින් සිටි බව ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. ඒ වන විට පී. එස්. ජේ. රත්නායක මහතා මාස 03 දින 10 ක පමණ කාලයක් අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුරේ සේවය කරමින් සිට ඇත. නමුත් මාස 03 ක් අවසන් වන විට කලින් එකඟව සිටි පරිදි ඔහු ඉල්ලා අස්වී නැත.

මහමැතිවරණයකින් පසුව ආණ්ඩුව වෙනස් වූ දිනය වන 2004.04.07 වන දින ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා ද ඉවත්ව ගොස් ඇත. ධීවර ඇමතිවරයාගේ ඇමති තනතුර ද අවසන් වී ඇත. 2004.04.07 දින මැතිවරණයේ දී නව ආණ්ඩුවක් පත්වූ නමුත් පී. එස්. ජේ. රත්නායක මහතා දිගටම සේවයේ යෙදී සිට ඇත. 2005.01.15 වන දින ඔහු සිය කැමැත්තෙන් ම සේවය හැරගොස් ඇත. ඒ වන විට පී. එස්. ජේ. රත්නායක මහතා අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුරේ අවුරුදු 01 මාස 02 දින 18 ක් පමණ වූ කාලයක් සේවය කර ඇත. නමුත් අතුකෝරල මහතා ඔහු ද ඉවත්ව යන තෙක්ම නිශ්ශබ්දව සිට ඇත. ඉල්ලුම්කරු ප්‍රකාශ කරන පරිදි 2003.10.01දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ට ලබා දී ඇති ලකුණු ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා විසින් ඊට පසුදින එනම් 2023.10.02 වන දින ඔහුගේ නිලකාමරයේදී වෙනස් කළ බවට ඉල්ලුම්කාර A. K. D. G. අතුකෝරල මහතා විසින් කරන ලද ප්‍රකාශය පරිදි ඔහු විසින් ඊට අදාළ ලකුණු වෙනස් කරන ලද ලේඛනය A7 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර එම ලේඛනය පිළිබඳව සාක්ෂි විභාගයේදී ප්‍රශ්න කිරීමට ද යෙදුනි. සාගර විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් මූලික සාක්ෂි ලබාදීමේ දී එම A7 ලෙස ලකුණු කරන ලද ලේඛනය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇති ලේඛනයේම සැබෑ ඡායා පිටපතක් ද යන්න ඔහුගෙන් විමසා සිටින ලදුව එය සැබෑ පිටපතක් බව සාක්ෂිකරු විසින් පිළිගෙන ඇත.

ප්‍ර - ඔය A7 ලේඛනය හොඳින් පරීක්ෂා කර බලා කියන්න ගරු අධිකරණයට ඔය සම්මුඛ පරීක්ෂණ වාර්තාව 2003 පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදුන් ලේඛනයේ පිටපතක් හැටියට තමයි ඔය තිබෙන්නේ හරිද?

පි - හරි

(2023.11.08 සාක්ෂි සටහන් පිටු අංක 13)

මෙම ලේඛනය ආයතනය සතු රහස්‍ය ලේඛනයක් බැවින් එය ඉල්ලුම්කාර අතුකෝරාල මහතාට ලැබුණේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් අතුකෝරල මහතා ප්‍රකාශ කර සිටියේ සභාපතිවරයා විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන ලද ලේඛනය වෙනස් කරන ලද දිනය වූ 2003.10.02 වන දිනයේදීම සභාපතිවරයා විසින් තමන්ට ද එහි ඡායා පිටපතක් ලබාදුන් බවකි.

ප්‍ර - එතකොට A7 කියන ලේඛනය ඡායා පිටපතක් ද?

පි - ඡායා පිටපතක් ස්වාමීනි

ප්‍ර - එතකොට සාක්ෂිකරු මේ A7 කියන ලේඛනයේ දිනය සඳහන් කර තියෙන්නේ පෑනකින්?

පි - පෑනකින්

ප්‍ර - එතකොට දැන් මේක සාක්ෂිකරු සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයක් නම් මේක රහසිගත ලේඛනයක් නේද?

පි - ඔව් ස්වාමීනි

ප්‍ර - එතකොට සාක්ෂිකරු කියන්න මේ ලේඛනය තමන් කොහොමද ලබාගත්තේ කියලා?

පි - ස්වාමීනි මේ සම්බන්ධව සභාපතිතුමා විසින් මා සහ මේජර් ජයන්ත රත්නායක මහතා කැඳවා සභාපතිතුමා විසින් ලකුණු වෙනස් කිරීමෙන් අනතුරුව සභාපතිතුමා විසින් මා වෙත එහි පිටපතක් ඉදිරියේදී අවශ්‍ය වුවහොත් පැහැදිලි කිරීමක් කරනවා නම් ජයන්ත රත්නායක මහතා ……………… (පිළිතුර සම්පූර්ණ නොකරයි)

ප්‍ර - ඒක මම මෙහෙම අහන්නම්. ඔබට ලැබුණේ ඔබ කියන්නේ සභාපතිතුමාගෙන් කියලා නේද කියන්නේ?

පි - එහෙමයි ස්වාමීනි

(2023 සාක්ෂි සටහන් පිටු අංක 6, 7)

එම ලේඛනයේ අයදුම්කරුවන් 8 දෙනෙකුගේ නම් සඳහන් වේ. මෙම ලේඛනය ප්‍රධාන තීරු (column) හයකට බෙදා ඇත. අයදුම්කරුවන්ගේ නම් පළමු ප්‍රධාන තීරුවේ පහලට දක්වා ඇත. දෙවන ප්‍රධාන තීරුවේ ඔවුන්ගේ ලිපිනයන් පිළිවෙලින් පහළට ඒ ඒ නම් ඉදිරියෙන් සිටින සේ දක්වා ඇත. තුන්වන ප්‍රධාන තීරුවේ අයදුම්කරුවන්ගේ වයස් ද හතරවන ප්‍රධාන තීරුවේ ඔවුනගේ අධ්‍යාපන සුදුසුකම් ද පස්වන ප්‍රධාන තීරුවේ ඔවුන් ලබා ඇති පළපුරුද්ද ද දක්වා ඇත. හයවන ප්‍රධාන තීරුව Remarks යනුවෙන් නම් කර අනු තීරු පහකට වෙන් කර ඇත. සම්මුඛ පරීක්ෂණය ලබාදෙන ලකුණු ක්ෂේත්‍ර හතරක් සඳහා ලබාදී ඇත. ලකුණු ලබාදීම සිදුකර ඇති ක්ෂේත්‍ර හතර පහත සඳහන් වේ.

- අධ්‍යාපන සුදුසුකම්
- පළපුරුද්ද
- අමතර සුදුසුකම් (Extra Curricular)
- සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂකවරු ලබාදෙන ලකුණු (Interview)

හයවන ප්‍රධාන තීරුවේ ඇති පළමු අනුතීරුවේ අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ද දෙවන අනුතීරුවේ පළපුරුද්ද සඳහා ලබාදෙන ලකුණු ද තුන්වන අනුතීරුවේ සුදුසුකම් සඳහා ලබාදෙන ලකුණු ද හතරවන අනුතීරුවේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාදෙන ලද ලකුණු ද පස්වන අනුතීරුවේ දක්වා ඇත්තේ මුල් අනුතීරු හතරේ ලබා දී ඇති ලකුණුවල එකතුව ද වේ.

මෙම ලේඛනයේ ලකුණු තමන් සහ රත්නායක මහතා ඉදිරියේදී සභාපතිවරයා විසින් වෙනස් කරන ලද බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන චෝදනාව සම්බන්ධයෙන් සාක්ෂි විභාගයේ දී අනාවරණය වූයේ කිසිවෙකු හෝ විසින් වෙනස් කර ඇත්තේ අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබා දී ඇති ලකුණු දැක්වෙන පළමු අනුතීරුවේ දක්වා ඇති ලකුණු පමණි. ඒ අනුව පස්වන අනුතීරුවේ දක්වා ඇති මුළු ලකුණු ප්‍රමාණය ද සංශෝධනය කර ඇත.

අතුකෝරල මහතාගේ හා රත්නායක මහතාගේ අධ්‍යාපන සුදුසුකම් එම ලේඛනයේ හතරවන ප්‍රධාන තීරුවේ දක්වා ඇති ආකාරයට පහත වෙන වෙනම දක්වා ඇත.

| A. K. D. G. අතුකෝරල මහතාගේ අධ්‍යාපන සුදුසුකම් | පී. එස්. ජේ. රත්නායක මහතාගේ අධ්‍යාපන සුදුසුකම් |
|---|---|
| B.com(sp) - 1987 | B.com(sp) - 1983 |
| Chartered Intermediate | Post Graduate Diploma in Business Mgt 2003 |
| | Following Master of Business Administration |
| | ICP Part II |
| | DPFM |
| | MAAT |
| | Chartered Accounting Stage iv |

මොවුන් දෙදෙනාගේ අධ්‍යාපන සුදුසුකම් සංසන්දනය කිරීමේදී රත්නායක යන අයගේ අධ්‍යාපන සුදුසුකම් වඩා වැඩි බව නිරීක්ෂණය වේ. නමුත් සම්මුඛ පරීක්ෂණයේ දී මේ දෙදෙනාටම අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් ලබාදී ඇත්තේ ලකුණු 30 බැගින් වූ සමාන ලකුණු ප්‍රමාණයකි. එසේ සමාන ලකුණු ලබාදීම දෝෂ සහිත බව දෙදෙනාගේ අධ්‍යාපන සුදුසුකම් සංසන්දනය කිරීමේ දී පෙනී යයි. නමුත් පසුව දෙදෙනාගේම එම ලකුණු ප්‍රමාණයන් පෑනකින් තනි ඉරකින් කපා අතුකෝරාල මහතාට ලකුණු 10 ක් ද රත්නායක මහතාට ලකුණු 17 ක් ද වනසේ වෙනස් කර සංශෝධනයට ලක්කර ඇත. එම ලකුණු වෙනස්කිරීමට ප්‍රථම දෙදෙනාගේම මුල් අනුතීරු හතරේ ලකුණුවල එකතුව වෙන වෙනම ලකුණු 75 බැගින් පස්වන අනුතීරුවේ දක්වා තිබී ඇත. නමුත් අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබා දෙන පළමුවන අනුතීරුවේ සඳහන් ලකුණු වෙනස්කිරීමෙන් පසුව අතුකෝරල මහතාගේ මුළු ලකුණු ප්‍රමාණය 55 ක් ලෙස ද රත්නායක මහතාගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 62 ක් ලෙස ද පස්වන අනුතීරුවේ සංශෝධනය කර ඇත. සාක්ෂි විභාගයේ දී ඉල්ලුම්කරු ඒ බව පිළිගෙන ඇත.

ප්‍ර - එතකොට මේජර් රත්නායක මහත්තයාත් කපාහරින්න පෙර ලකුණු 75 ක් ලබාගෙන තියෙනවා?

පි - එහෙමයි ස්වාමීනි

ප්‍ර - එතකොට ඔබත් ලකුණු 75 ක් අරගෙන තියනෙවා?

පි - එහෙමයි ස්වාමීනි

(2023.06.28 දින සාක්ෂි සටහන් පිටු අංක 16)

ඉල්ලුම්කාර අතුකොරාල මහතා ලකුණු වෙනස් කිරීමට ප්‍රථම වැඩිම ලකුණු ලබා පළමු තැන ලබා තිබුණේ යැයි ප්‍රකාශ කිරීම පිළිගත නොහැක. ඊට හේතුව ලකුණු වෙනස් කිරීමට ප්‍රථම අතුකොරාල මහතා සහ රත්නායක මහතා ලබා ඇත්තේ මුළු ලකුණු 75 බැගින් වූ සමාන ලකුණුය.

අධ්‍යාපන සුදුසුකම් සඳහා ලබාදෙන ලකුණු ප්‍රමාණය වෙනුවෙන් ලකුණු වෙනස් කිරීමට පෙර දෙදෙනාටම සමානව ලකුණු 30 බැගින් ලබා දී තිබීම වැරදි බව ද පසුව එම ලකුණු වෙනස්කර රත්නායක මහතාට අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු 17 ක්ද

අතුකොරල මහතාට ලකුණු 10 ක් ද වෙනස් කිරීම සාධාරණ බව ද පෙනේ. ඊට හේතුව අතුකෝරාල මහතාගේ අධ්‍යාපන සුදුසුකම් වලට සාපේක්ෂව රත්නායක මහතාගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ මට්ටමක පැවැතිමයි. එසේ ලකුණු වෙනස්කිරීමෙන් පසු අතුකොරාල මහතාගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ මට්ටමක පැවැතීමයි. එසේ ලකුණු වෙනස්කිරීමෙන් පසු අතුකෝරාල මහතාගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 55 ක් ලෙස ද රත්නායක මහතාගේ මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 62 ක් ලෙස ද සංශෝධනය වී තිබීම සාධාරණ බැව් පෙනී යයි. සාක්ෂි විභාගයේ දී අතුකෝරාල මහතා විසින් අධ්‍යාපන සුදුසුකම් අනුව රත්නායක මහතාට වැඩි ලකුණු ප්‍රමාණය ලබා දීම සාධාරණ බව ව්‍යංගයෙන් පිළිගනී.

ප්‍ර - එතකොට සාක්ෂිකරු මේ සංශෝධනය වෙලා තියෙන්නේ අධ්‍යාපන සුදුසුකම් කියන තීරුව නේද? එතකොට දැන් ඔබ මේ ගරු අධිකරණයට අංක 01 යටතේ අයදුම් කළ ඔබගේත් ඒ වගේම අංක 8 යටතේ අයදුම් කළ මේජර් රත්නායකගේත් අධ්‍යාපනය සුදුසුකම් ප්‍රකාශ කලා.

පි - එහෙමයි ස්වාමීනී

ප්‍ර - එතකොට ඔබට වඩා මම ඔබට යෝජනා කරනවා මේජර් රත්නායක ගේ අධ්‍යාපන සුදුසුකම් ප්‍රමාණය වැඩිය කියලා ඔහු විසින් ශාස්ත්‍රපති මාස්ටර් උපාධියක් පවා හදාරමින් ඉඳලා තියනවා ඒ වගේම ඊට අමතරව ICA PART II, DPFM, MAAT වගේ දේවලුත් ඔහු විසින් හදාරල තියෙනවා. එහෙම නේද?

පි - එහෙම සඳහන් වෙනවා

(2023.06.28 සාක්ෂි සටහන් පිටු අංක 17, 18 )

මේ අනුව පෙනී යන්නේ ඉල්ලුම්කාර අතුකෝරාල මහතා පවසන පරිදි සභාපතිවරයාගේ නිල කාමරයේදී රත්නායක සහ අතුකෝරාල යන අයගේ ලකුණු සභාපතිවරයා විසින් වෙනස් කර රත්නායක මහතාට ඉහල ලකුණු ප්‍රමාණයක් ලබාදී අදාළ තනතුරට පත්කළේය යන්න පිළිගැනීමට අපහසු බවත් වැඩි අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති රත්නායක මහතාගේ ලකුණු ප්‍රමාණය වැඩි වන ලෙසත් අඩු අධ්‍යාපන සුදුසුකම් සහිත අතුකෝරල මහතාගේ ලකුණු ප්‍රමාණය අඩුවන ලෙසත් සම්මුඛ පරීක්ෂණය පැවති 2023.10.01 දිනයේදීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම එම අවස්ථාවේදීම සිදු කරන්නට ඇත යන්න සාධාරණ මිනිසෙකු විසින් බලන කෝණයෙන් බැලූ විට තේරුම්ගත හැකිය.

සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ දිනයට පසු දින සභාපතිවරයාගේ නිල කාමරයේදී නීති විරෝධීව එම ලකුණු වෙනස් කිරීම සිදුකළේ නම් එම ලේඛණයේ පිටපතක් සභාපතිවරයා විසින් අතුකෝරාල මහතා වෙත ලබා දෙනු ඇතැයි විශ්වාස කළ නොහැක.

අතුකෝරාල මහතා විසින් සාක්ෂි විභාගයේදී පවසන ලද පරිදි රත්නායක මහතා සහ අතුකෝරාල මහතා අතර ඇති වූ එකඟතාවයට අනුව රත්නායක මහතා අධ්‍යක්ෂ (පාලන හා මුලා) තනතුරට පත්වී මාස 03 කින් පසු ඔහු එම තනතුරෙන් ඉල්ලා අස්වීමෙන් අනතුරුව අතුකෝරාල මහතාට එම තනතුර සඳහා පත්වීමක් ලබා දීමට කටයුතු කරන බවට සභාපති පොරොන්දු වී ඇත. ඒ අනුව මාස 03 ක සේවා කාලය නිමවා රත්නායක මහතා සිය කැමැත්තෙන් තනතුරින් ඉවත් වූයේ නම් සභාපතිවරයාට සත්‍ය වශයෙන්ම කළ හැකි වනුයේ ආයතනය විසින් අනුගමනය කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුවත්පත් දැනවීම් මගින් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සෙකු තෝරා ගැනීම පමණකි. එහිදී අතුකෝරල මහතාට එම තනතුරයට පත්වීමට හැකි වෙතැයි ස්ථිරවම බලාපොරොත්තු තැබිය හැකි නොවනු ඇත.

A.K.D.G. අතුකෝරල මහතා සාක්ෂි ලබා දීමේ දි හරස් ප්‍රශ්ණ වලට උත්තර දෙමින් තමන් එකඟ වූයේ මාස 03 කට පමණක්

රත්නායක මහතාට තනතුර ලබාදීමට පමණක් බවත් අනතුරුව එම තනතුර තමන්ට ලබාදීමට සභාපතිවරයා එකඟ වූ බවත්ය.

ප්‍ර - බෙරුම්කරණයට යොමු කර ඇති 2003 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයෙන් යම්කිසි අසාධාරණයක් සිදුවුනා නම් ඔබගේ අනුදැනුම ඇතිව සිදුවුනේ කියලා මම යෝජනා කරනවා?

පි - ප්‍රතික්ෂේප කරනවා. ඒ අවස්ථාවේදී මා වෙත යෝජනා කළා මාස 03 ක කාලයක් ජයන්ත රත්නායක මහතාට තනතුර ලබාදීම සම්බන්ධයෙන් එම මාස 03 ක කෙටි කාලයකට මිස දීර්ඝකාලීන ලෙස එම තනතුර ලබාදීමට මා එකඟ වූයේ නැහැ.
(2023.07.18 සාක්ෂි සටහන් පිටු අංක 19)

එමෙන්ම ආයතනය තුළ පවත්නා බඳවා ගැනීමේ පටිපාටිය අනුව නව තනතුරකට පත්වීමක් ලබාදීමේදී ක්‍රියා කල යුතු ආකාරය කුමක් ද යන්න සාගර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා තම සාක්ෂියේදී කරුණු පැහැදිලි කර ඇත.

ප්‍ර- එතකොට සාක්ෂිකරු සාක්ෂිකරුට කියන්න පුළුවන් ද වැඩ බැලීමේ තනතුරට පත්කිරීමයි සාමාන්‍යයෙන් ස්ථිර සේවකයෙක් යම්කිසි තනතුරකට පත්කිරීමයි අතර වෙනසක් තියෙනවද? සමානකමක් තිබෙනවද?

පි- වෙනසක් තියෙනවා

ප්‍ර - වෙනස මොකක්ද කියලා පැහැදිලි කරන්න

පි- ආයතනයකට ස්ථිර පදනම මත පත්වීමක් ලබා දීමෙන් රජයේ ක්‍රියා පටිපාටිය තමයි එම තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව තිබෙන සුදුසුකම් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඊට අමතරව අදාළ පළපුරුද්ද සම්බන්ධයෙන් ඒ තනතුරට අදාළව පුවත්පත් දැන්වීමක් හෝ එම දැන්වීම ක්‍රියා මාර්ගයකින් ජනතාවට දැනුම්දීමක් කරලා සම්මුඛ පරීක්ෂණයක් එම සම්මුඛ පරීක්ෂණය අනුව වඩාත්ම සුදුසු පුද්ගලයා තෝරාගැනීම මේ කාරණාව සම්බන්ධයෙන් ඇක්ටින් බේසික් කියන්නේ ඒ ස්ථිර තනතුරක් නොවේ. නමුත් පරිපාලනයට පුළුවන්කම තියෙනවා ඒ අවස්ථාවේ හැටියට ඇතිවෙලා තියෙන පුරප්පාඩුව අනුව සිටින පුද්ගලයන්ගෙන් වඩාත් සුදුසු පුද්ගලයා පත් කරන්න. එය ආයතන සංග්‍රහය මගින් සිදු කෙරෙන කාර්යයකි.

(2023.12.21 සාක්ෂි සටහන් පිටු අංක 5, 6)

තත්ත්වය එසේ තිබියදී අතුකෝරල මහතා සහ රත්නායක මහතා අතර ඇති කරගත් එකඟතාවය මත රත්නායක මහතා මාස 03 කට පසු සිය තනතුර හැර ගිය ද ඉන් අනතුරුව එම තනතුරට අතුකෝරාල මහතා පත්කිරීමට සභාපතිවරයා දුන් පොරොන්දුව කෙරෙහි ඔහු විශ්වාසය තබා සිටියේ යැයි කීම, ඉහල අධ්‍යාපන සුදුසුකම් හා කළමණාකරණ මට්ටමේ දීර්ඝකාලීන පළපුරුද්දක් සහිත ඉහළ විධායක තනතුරක් අපේක්ෂා කරන අතුකෝරාල මහතා වැනි පුද්ගලයෙකුට තරම් නොවනු ඇත.

කෙසේ වුව ද රත්නායක මහතා 2003.10.27 වන දින අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) තනතුරට පත්වීමෙන් අනතුරුව මාස 03 ක් ඉක්මවා ගිය පසුව ඔහු තනතුරෙන් ඉවත් වී අතුකෝරාල මහතාට එම තනතුර ලබාගැනීමට අවස්ථාව ලබා දී නැත. ඒ අනුව සභාපතිවරයා විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දුන් ලේඛනය නීතිවිරෝධීව වෙනස් කිරීමෙන් තමන්ට සිදු වූ අසාධාරණය පිළිබඳ අතුකෝරාල මහතා විසින් මාස 03 ක් ඉක්මවා ගිය පසුව සභාපතිවරයාගෙන් සාධාරණය ඉටුකරන ලෙස ඉල්ලීමක් කිරීමට හෝ නීතිමය පියවර ගැනීමට පෙළඹී ද නැත. රත්නායක මහතාගේ නව පත්වීමෙන් මාස 03 ක් ඉක්ම ගිය වහාම අතුකෝරාල මහතා විසින් නීතිමය පියවර ගත්තේ නම් ඊට අදාළ ප්‍රධාන සහ සජීවී සාක්ෂිකරුවන් වන සභාපතිවරයා සහ රත්නායක මහතා එම අවස්ථාවේ ධුරයේ රැඳී සිටින බැවින් සාධාරණ තීන්දුවක් ලබා ගැනීමට ඔහුට හැකියාව තිබුණි.

නමුත් සභාපතිවරයා 2004.04.07 දින තනතුරෙන් ඉවත්ව යනතුරුත් අතුකෝරල මහතා විසින් කිසිදු පියවරක් ගෙන නැත. ඊට ද මාස ගණනකට පසුව රත්නායක මහතා තනතුරෙන් පෞද්ගලික හේතූන් මත ඉවත්ව ගොස් ඇත්තේ 2005.01.15 වන දින දී වුව ද ඔහු ද එසේ සේවය හැර යන තෙක් අතුකෝරල මහතා නිද්‍රාවේ පසු වී ඇත.

ඉන් පසු පළමුවරට ඔහු ක්‍රියාත්මක වී ඇත්තේ නව සභාපතිවරයෙකු පත්වීමෙන් පසුව 2005.01.31 වන දින දීය. එනම් තමන්ට සිදු වූ අසාධාරණය පිළිබඳව නව සභාපතිවරයාට ලිපියකින් (සාක්ෂි විභාගයේදී A4 ලෙස සළකුණු කර ඇත). දැනුවත් කර පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුරට තමන් පත් කරන ලෙස ඉල්ලා ඇත. අදාළ සියලු සාක්ෂි මැකී යන තෙක් බලා සිට ඔහු විසින් තමන්ට සාධාරණත්වය ඉටු කරන ලෙස, සිද්ධිය පිළිබඳ කිසිවක් නොදන්නා සහ ඊට අදාළ පිළිගත හැකි සාක්ෂියක් පිළිබඳව ද නොදන්නා නව සභාපතිවරයගෙන් ඉල්ලා ඇත. සියලු සාක්ෂි මැකී ගොස් තිබියදී අතුකෝරාල මහතා විසින් දිගින් දිගටම 2006.02.22, 2007.01.25, 2008.10.09, දින දරන ලිපි මගින් ද (සාක්ෂි විභාගයේ A8, A11, A15 ලෙස ලකුණු කරන ලද ලිපි) නව සභාපතිවරයාගෙන් තමන්ට සාධාරණය ඉටු කරන ලෙස ඉල්ලා ඇතත් එම කිසිදු ලිපියකට නව සභාපතිවරයා විසින් ප්‍රතිචාර දක්වා නැත. ඔහුට සිදු වූ අසාධාරණය පිළිබඳ පිළිගත හැකි සාක්ෂියක් නොමැති බැවින් සහ අතුකෝරාල මහතා සහ රත්නායක මහතා අතර ඇති කරගෙන ඇති එකඟකාවය ආයතනයේ පවත්නා බඳවා ගැනීමේ පටිපාටියට පටහැනි බැවින් එසේ ප්‍රතිචාර නොදක්වා ඇති බව පෙනේ.

තමන්ට 2003 වසරේදී සිදු වූ අසාධාරණය පිළිබඳ නෛතික පියවර පළමු වරට ගෙන ඇත්තේ 2008 වර්ෂයේදී කම්කරු කොමසාරිස් වෙත පැමිණිලි කිරීම මගින් බව ඉල්ලුම්කාර අතුකෝරාල මහතා සාක්ෂි විභාගයේදී කියා සිටී. තවදුරටත් සාක්ෂි දෙමින් ඔහු කියා සිටින්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2008.12.30 වන දින සිට කිහිප වරක්ම දෙපාර්ශ්වයට කැඳවීම් කළ නමුත් දෙවන පාර්ශ්වය ඊට සහභාගි වී නැත. ඒ හේතුව නිසාම එම පැමිණිල්ල යටපත් වී ඇති අතර ඊට කුමක් සිදු වීද යන්න තමන් නොදන්නා බවකි. මෙහිදී ද අතුකෝරාල මහතා සිතාමතාම නිසි පියවරක් නොගෙන සිදුවන දෙය දෙස බලා සිටීම පමණක් සිදුකර ඇත. කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වන කර්මික ආරාවුලක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වයට කැඳවීමක් කළවිට දෙවන පාර්ශ්වය හෙවත් සේවායෝජක පාර්ශ්වය පැමිණ පෙනී නොසිටින්නේ නම් සහ ඊට නිසි පියවර නොගැනීමට නිලධාරින් අකර්මන්‍ය ව සිටින්නේ නම් සේවක පාර්ශ්වයට ගත හැකි ක්‍රියා මාර්ග කිහිපයක්ම ඇත. එවැනි විටක සහකාර කම්කරු කොමසාරිස්වරයා හමුවී පැමිණිලි කළ හැක. එයිනුදු සැහිමකට පත්වීමට නොහැකි නම් කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමටත් එයිනුදු පලක් නොවන්නේ නම් කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු කොමසාරිස්වරයා හෝ විශේෂ විමර්ශණ අංශයේ කම්කරු කොමසාරිස්වරයා වෙත අභියාචනයක් කළ හැක. එයිනුදු පළක් නොවන්නේ නම් අවසානයේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට පැමිණිලි කර ඔහුගේ අවධානයට යොමු කළ හැක.

මේ අයුරින් අතුකෝරාල මහතා විසින් ඉහල නිලධාරින් වෙත පැමිණිලි කළේ නම් 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 36 (අඅ) වගන්තිය යටතේ විධාන පත්‍රයක් සේවායෝජක වෙත යවා ඊට ද ඔහු විසින් අවනත නොවන්නේ නම් සේවායෝජකට එරෙහිව අදාළ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට කම්කරු කොමසාරිස්වරයාට බලය පැවරී ඇත.

සේවායෝජක පාර්ශ්වය පැමිණිලි පරීක්ෂණයට ඉදිරිපත් නොවන්නේ නම් ඉහත පරිදි ක්‍රියාකිරීමට හැකියාව තිබියදී අතුකෝරාල මහතා දිගටම නිද්‍රාවේ සිට ඇත.

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත අනුව 2015.06.17 වන දින සිට මෙම ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය සාගර විශ්වවිද්‍යාලය බවට පරිවර්තනය කරන ලද අතර ජාතික ධීවර හා නාවික ඉංජිනෙරු ආයතනයකට අයත් සියලු වත්කම් සාගර විශ්වවිද්‍යාලයට පැවරුණි. සාගර විශ්වවිද්‍යාල පනතේ 70, 71 වගන්ති ප්‍රකාරව ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සියලුම මානව සම්පත් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරගැනීමටත් ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද අනුව තමන් දරමින් සිටි තනතුරට අනුරූප සාගර විශ්වවිද්‍යාලයේ තනතුරක පිහිටු වීමටත් කටයුතු කර ඇත. සාගර විශ්ව විද්‍යාලයට

අන්තර්ග්‍රහණය වීමට අකමැති සේවකයින්ට විශ්‍රාමයෑමේ අවස්ථාව ලබාදී ඇත. සාගර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා සාක්ෂි දෙමින් මෙම තත්ත්වය පැහැදිලි කර ඇත.

ප්‍ර- සේවකයින් අන්තර් ග්‍රහනය කිරීමේදී සේවකයින් සම්බන්ධ වගකීම් ඒ කියන්නේ කලින් ආයතනයේ හිටපු සේවකයින් සම්බන්ධයෙන් වන්නා වූ වගකීම් වලට සාගර විශ්වවිද්‍යාලය මේ පනත අනුව බැඳී සිටිනවාද?

පි- බැඳී සිටිනවා
(2023.09.11 වන දින සාක්ෂි සටහන් පිටු අංක 17)

ප්‍ර - එතකොට සාක්ෂිකරු 71.2 (ආ) කියන වගන්තිය අනුව සාක්ෂිකරු වග උත්තරකාර ආයතනයේ වගකීම් නැතිනම් බැඳීමකට යටත් වන්නේ මොන සේවා ගිවිසුම් සම්බන්ධයෙන්ද ?

පි - මේ 71 වන වගන්තිය අනුව පෙර පැවති ආයතනයේ වගකිම් සම්බන්ධයෙන් එදිනට පවතින වගකීම සම්බන්ධයෙන් නව ආයතනය වගකීමට බැඳෙනවා
(2023.12.21 දින සාක්ෂි සටහන් පිටු අංක 08)

මෙම අන්තර් ග්‍රහණයේදී සාගර විශ්වවිද්‍යාල පනතේ 70 වන වගන්තියට අනුව දක්වා ඇති ක්‍රමවේදය අනුගමනය කරමින් අතුකෝරාල මහතා වෙතද ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර ලබාදීමට සාගර විශ්වවිද්‍යාලය විසින් අර්පණයක් කර ඇත. එකී අර්පණය අතුකෝරාල මහතා විසින් පිළිගෙන එම තනතුරට පත්වී ඇත. එසේ සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරගත් සේවකයින්ට එම අන්තර් ග්‍රහනයේදී උද්ගතව ඇති ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා සාගර විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන අනුව නිර්මාණය කරන ලද අභියාචනා කමිටුවට පැමිණිලි කිරීමේ අවස්ථාව ලබාදී ඇත. ඒ අනුව අතුකෝරාල මහතාද තමාට ලබාදී ඇති වැටුප් ශ්‍රේණිය වූ UEX2 (ii) ප්‍රමාණවත් නොවන බවට අභියාචනා කමිටුවට 2018.03.15 දින කරන ලද පැමිණිල්ල අනුව අභියාචනා කමිටුව විසින්, (UEX2 (i) ක වැටුප් ශ්‍රේණිය අතුකෝරල මහතා පිහිටුවීමට ද තීරණය කර ඇති අතර අතුකෝරල මහතා විසින් එම තීරණය පිළිගෙන ඇත. සාගර විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් සාක්ෂි දෙමින් ඒ බැව් සනාථ කර ඇත.

ප්‍ර- එතකොට සාක්ෂිකරු මේ කියන ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු පිළිගැනීමකුත් කරලා තියෙනවා දෙවන වතාවටත්? (R5 ලේඛනය පෙන්වමින් ප්‍රශ්න කරයි. )

පි- පිළිගැනීමක් කරලා තිබෙනවා
(2023.09.11 දින සාක්ෂි සටහන් පිටු අංක 14)

මේ අනුව අභියාචනා කමිටුවේ තීරණය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය) තනතුර වැටුප් ශ්‍රේණිය UEX 2 (i) සහිතව දෙවන වතාවටත් පිළිගෙන ඇත. R6 ලෙස ලකුණු කරන ලද ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර වැටුප් ශ්‍රේණිය UEX 2 (ii) සහිතව පළමු වතාවේ පිළිගෙන ඇත. ඒ අනුව සාගර විශ්වවිද්‍යාලය විසින් කරන ලද අර්පණයට ප්‍රතිචාර වශයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර දෙවතාවකදීම අතුකෝරල මහතා විසින් පිළිගෙන ඇත.

ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ තමන් දරමින් සිටි ගණකාධිකාරි තනතුරට අනුරූප තනතුරක සහ වැටුප් ශ්‍රේණියක අතුකෝරල මහතා පිහිටුවා ඇති අතර එම තනතුර අතුකෝරල මහතා විසින් දෙවතාවකදීම පිළිගෙන ඇත. එම තනතුර තමන් දරමින් සිටි තනතුරට අනුරූප නොවන්නේ නම් ඒ පිළිබඳවද අභියාචනා කමිටුවට පැමිණිලි කළ හැකිව තිබුණි. එබැවින්

මෙම අන්තර්ගහ්‍රණයේදී අකෝරල මහතාට අසාධාරණයක් සිදුව ඇති බවක් නිරීක්ෂණය නොවේ.

කෙසේ නමුත් අතුකෝරල මහතා නැවතත් නිද්‍රාවෙන් නැගී සිටින්නේ තමන්ට 2003.10.01 හෝ 2003.10.02 දින සිදු වූ අසාධාරණය පිළිබඳව අංක CN/COM/2018-8/37 යටතේ කම්කරු දෙපාර්තමේන්තුවට 2018.08.24 දින නැවතත් පැමිණිලි කිරීමෙනි. මෙම පැමිණිලි විභාගය සඳහා වග උත්තරකාර සේවායෝජක ලෙස නම්කර ඇත්තේ සාගර විශ්වවිද්‍යාලය වේ.

මෙම පැමිණිල්ලෙන් කියවෙන්නේ 2003.10.01 වන දින අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුරට බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයේ දී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දුන් ලේඛනය වෙනස්කර තමන්ට ලැබිය යුතු තනතුර වෙනත් අයෙකුට ලබා දීමට ක්‍රියාකළ බවත් ඒ අනුව තමන්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්ය. ඒ හේතුවෙන් සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේ දී තමන්ට එම විශ්ව විද්‍යාලයේ ඉහල තනතුරකට පත් වීමට තිබූ අවස්ථාව ඇහිරී ගිය බවත්ය.

මෙම පැමිණිලි විභාගය පවත්වන ලද කම්කරු නිළධාරිණිය වන සුනීතා රත්නායක මහත්මිය විසින් කිහිපවිටක්ම දෙපාර්ශ්වය පැමිණිලි විභාගය සඳහා කාර්යාලයට කැඳවා ඇත. 2018.12.24 වන දින සේවා යෝජක පාර්ශ්වය වෙනුවෙන් එවකට සාගර විශ්ව විද්‍යාලයේ උපකුලපති තනතුර දැරූ තිලක් ධර්මරත්න මහතා පෙනී සිට ඇත. එදින පරීක්ෂණයෙන් පසුව කම්කරු නිළධාරිවරිය විසින් සකස් කරන ලද පරීක්ෂණ වාර්ථාවේ දක්වා ඇත්තේ " අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවට තමන් පිළිගන්නා බවත් ඒ පිළිබඳ සාගර විශ්වවිද්‍යාලයේ පාලක සභාවට කරුණු ඉදිරිපත් කර අතුකෝරල මහතාට සාධාරණයක් ඉටුකිරීමට පාලක සභාවේ අනුමැතිය ලබාගැනීමට තමන් පොරොන්දු වන බවට " උපකුලපතිවරයා විසින් ප්‍රකාශ කළ බවකි.

අතුකෝරල මහතාට සිදු වී ඇතැයි ඔහු විසින් කියා සිටින ඉහත අසාධාරණය සත්‍ය සිදුවීමක් බව ඔප්පු කිරීමට උපකුලපතිවරයාගේ මෙම ප්‍රකාශය ප්‍රබල සාක්ෂියක් ලෙස හුවා දැක්වීමට පළමු පාර්ශ්වය විසින් කරුණු ඉදිරිපත් කරයි.

මෙම කාර්මික ආරාවුල පිළිබඳව පරීක්ෂණ පැවැත් වූ කම්කරු නිළධාරීවරිය 2019.01.01 වන දින ස්ථාන මාරුවීමක් ලබා එම දෙපාර්තමේන්තුවේම වෙනත් අංශයකට ගොස් ඇති අතර 2020.04.17 වන දින විශ්‍රාම ලබා ඇත. 2019.01.01 දින සිට මෙම පැමිණිලි පරීක්ෂණයේ ඉදිරි කටයුතු භාරව සිට ඇත්තේ ජානක තිලකරත්න නැමති වෙනත් කම්කරු නිළධාරියෙකු විසිනි. ඔහු විසින් සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපති තිලක් ධර්මරත්න මහතා වෙත 2019.03.14 වන දිනැති ලිපියක් යවමින් පෙන්වා දෙන්නේ උපකුලපතිවරයා විසින් 2018.12.24 වන දින පැවති පැමිණිලි පරීක්ෂණයේ දී අතුකෝරල මහතා වෙත අසාධාරණයක් සිදු වී ඇති බවට තමන් පිළිගන්නා බවත් ඒ පිළිබඳ සියලු කරුණු විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමට කටයුතු කර පාලක සභාවේ තීරණය කම්කරු නිළධාරිවරයා වෙත දැන්වීමට උපකුලපතිවරයා විසින් කටයුතු කිරීමට එකඟ වී ඇති බවත්ය.

ඒ අනුව කඩිනමින් තමන් වෙත පාලක සභාවේ තීරණය දන්වා එවන ලෙස කම්කරු නිළධාරිවරයා එම ලිපියෙන් ඉල්ලා ඇත. (එම ලිපිය A 29 ලෙස ලකුණු කර ඇත) ඊට පිලිතුරු ලෙස උපකුලපති තිලක් ධර්මරත්න මහතා විසින් 2019.06.14 දිනැති ලිපිය කම්කරු නිලධාරිවරයා වෙත එවා ඇත. (එම ලිපිය A 30 ලෙස ලකුණු කර ඇත.) එම ලිපියෙන් කියවෙන්නේ අතුකෝරල මහතා විසින් තමා වෙත පෙන්වන ලද ලිඛිත කරුණු වලට අනුව අතුකෝරල මහතාට පැහැදිලි අසාධාරණක් සිදු වී ඇති බව තමන් පිළිගත් බවත් ඒ පිළිබඳ සියලු කරුණු විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කර පාලක සභාවේ තීරණය කම්කරු නිළධාරීවරයා වෙත දන්වන බවත්ය. නමුත් උපකුලපතිවරයා විසින් මෙම ලිපිය අත්සන් කර ඇති දිනය වූ 2019.06.14 වන දිනයේදීම තම සේවා කාලය අවසන් කර උපකුලපති තනතුරෙන් ඉවත්ව ගොස් ඇති බව ද සැලකිල්ලට ගත යුතුව ඇත.

නමුත් මූලික පරීක්ෂණය කරන ලද කම්කරු නිළධාරී සුනීතා රත්නායක මිය විසින් සකස් කරන ලද පැමිණිලි පරීක්ෂණ

වාර්ථාවේ දක්වා ඇත්තේ " අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවට උපකුලපතිවරයා විසින් පිළිගත්තේය" යනුවෙනි. උපකුලපතිවරයාගේ 2019.06.14 දිනැති ඉහත ලිපියේ දැක්වෙන්නේ තමා වෙත පෙන්වන ලද ලිඛිත කරුණු වලට අනුව අතුකෝරල මහතාට පැහැදිලි අසාධාරණයක් සිදු වී ඇති බවට තමා පිළිගත්තේය යනුවෙනි.

මේ අනුව කම්කරු නිළධාරි සුනීතා රත්නායක මියගේ පරීක්ෂණ වාර්තාවේ සඳහන් උපකුලපතිවරයාගේ ප්‍රකාශයට වඩා උප කුලපති විසින් අත්සන් කරන ලද ඔහුගේ 2019.06.14 දිනැති ලිපියේ සඳහන් ආකාරයට ඔහුගේ ප්‍රකාශය පිළිගැනීමට හේතු පවතී. එනම් කම්කරු නිළධාරිවරියගේ පරීක්ෂණ වාර්ථාවේ සඳහන් කරුණු සාවද්‍ය නොවන්නේ නම් කම්කරු නිළධාරිවරියගේ පරීක්ෂණයේදී පහත සඳහන් දුර්වලතා ඇය අතින් සිදු වී නොතිබිය යුතුය.

1. කම්කරු නිළධාරි සුනීතා රත්නායක මිය විසින් තම පරීක්ෂණයේ දී උපකුලපතිවරයා විසින් කර ඇති ප්‍රකාශය අනුව ඔහුගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගෙන නැත.

2. උපකුලපතිවරයා විසින් අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගෙන ඒ පිළිබඳ කරුණු විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කිරීමට කරන ලද එකඟතාවය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 12.1 වගන්තිය යටතේ නිරවුල් කිරීමේ ලිඛිත ගිවිසුමකට එළඹීමට කම්කරු නිළධාරිවරිය විසින් කටයුතු කර නැත

3. අදාළ පැමිණිලි විභාග පරීක්ෂණයට අදාළ තමන් විසින් සකස් කරන ලද වාර්ථාව තමන්ගේ නිර්දේශයද සමග තම ඉහල අධීක්ෂණ නිළධාරියා වන සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කර තමාගේ නිර්දේශ අනුමත කරවා ගැනීමක් හෝ උපදෙස් ලබා ගැනීමට කම්කරු නිළධාරි විසින් කටයුතු කර නැත. මෙම තත්ත්වය කම්කරු නිළධාරීවරයෙක් විසින් තම රාජකාරි පිළිබඳව කරන ලද බරපතල නොසලකා හැරීමකි.

එබැවින් ඉහත උපකුලපතිවරයාගේ 2019.06.14 දිනැති ලිපියේ ඔහු විසින් සඳහන් කර ඇති පරිදි අතුකෝරල මහතා විසින් පෙන්වන ලද ලිඛිත කරුණු වලට අනුව ඔහුට අසාධාරණයක් සිදු වී ඇති බවට උපකුලපතිවරයා විසින් පිළිගත්තේය ලෙසට ඔහු විසින් එම ප්‍රකාශය කර ඇති බව පිළිගැනීමට සිදු වේ. ඒ අනුව " අතුකෝරල මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත කරුණු සත්‍ය ද යන්න තීරණය කිරීමෙන් තොරව උපකුලපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් අතුකෝරල මහතාට අසාධාරණයක් සිදුවූ වී ඇත යන්න නිශ්චිතවම නිශ්චය කළ නොහැකි වනු ඇත.

2018.12.24 වන දින කම්කරු කාර්යාලයේ දී පැවති පැමිණිලි පරීක්ෂණයට සහභාගී වෙමින් උපකුලපතිවරයා විසින් ප්‍රකාශ කර ඇත්තේ අතුකෝරල මහතාට සිදුව ඇති අසාධාරණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලක සභාවට කරුණු ඉදිරිපත් කර සහනයක් ලබා දීමට පියවර ගන්නා බවකි. නමුත් උපකුලපතිවරයා 2019.03.14 දින වන විටත් පොරොන්දු වූ පරිදි පාලක සභාවට මෙම කරුණු ඉදිරිපත් කර නැත. 2019.03.14 වන දින කම්කරු නිළධාරීවරයාගේ ලිපිය ලැබීමෙන් පසුවද ඔහු ඒ සඳහා පියවරක් ගෙන නැත. උපකුලපතිවරයාගේ සේවා කාලය අවසන් වන 2019.06.14 වන දින ඔහු ලිපියක් යවමින් කම්කරු නිළධාරීවරයාගේ 2019.03.14 දින දරන ලිපියට පිළිතුරු වශයෙන් කියා සිටින්නේ අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවට වූ කරුණු ඉදිරි කාලයේ දී පාලක සභාවට ඉදිරිපත් කරන බවයි. කම්කරු නිළධාරීවරයාගේ පැමිණිලි පරීක්ෂණයේ දී මෙම පොරොන්දුව උපකුලපති විසින් පළමුවරට සිදු කළ දිනයේ සිට උපකලපතිවරයා සිය ධූරයේ සේවය අවසන් වන දිනය දක්වා වූ මාස 6 ක පමණ කාලයක් ධූරයේ රැඳී සිටිය ද ඉටු නොකළ දෙයක් ඔහු ධූරය හැරයාමෙන් පසුව කරන බවට ප්‍රකාශ කිරීම මඟින් පෙනී යන්නේ අතුකෝරල මහතා රැවටීමට උපකුලපතිවරයා විසින් ක්‍රියාකර ඇති බවකි.

නමුත් උපකුලපතිවරයා විසින් කම්කරු නිළධාරිවරිය ඉදිරියේ දී අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව තමා

පිළිගන්නා බවට කරන ලද ප්‍රකාශය 2018.12.24 වන දින කම්කරු නිළධාරීවරියගේ වාර්ථාවේ දක්වා තිබීම සාවද්‍යා නොවන බව තහවුරු කිරීමට තව දුරටත් උත්සහ කිරීම සඳහා එම කම්කරු නිළධාරිවරිය සාක්ෂි සඳහා කැඳවීමට පළමු පාර්ශ්වය විසින් කරන ලද ඉල්ලීමට අවසර දීමට තීරණය කළෙමි.

සාක්ෂි විභාගයේ දී කම්කරු නිළධාරි සුනීතා රත්නායක මහත්මිය කියා සිටියේ සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපති තිලක් ධර්මරත්න මහතා 2018.12.24 වන දින පැමිණිලි විභාගය සඳහා පෙනී සිටි බවත් අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව තමා පිළිගන්නා බව කියා සිටි බවත්ය. නමුත් කම්කරු නිලධාරිවරිය විසින් උපකුලපතිවරයාගේ එම ප්‍රකාශයට අදාලව ඔහුගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබා ගෙන නැත. තවද උපකුලපතිවරයා තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ මේ පිළිබඳ සියලු කරුණු විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගෙන පාලක සභාවේ තීරණය නැවත කම්කරු නිලධාරිවරිය වෙත දන්වන බවකි. එවැනි එකඟතාවයක් ඇති වූ වහාම කම්කරු නිලධාරිවරියගේ වගකීම වනුයේ කාර්මික ආරාවුල් පනතේ 12.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්ශ්වය අතර නිරවුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කරවාගෙන ඒ අනුව කාර්මික ආරාවුල නිරවුල් කිරීමට පියවර ගැනීමය. නමුත් කම්කරු නිලධාරිවරිය එම වගකීම ඉටු කර නැත. කම්කරු නිලධාරි සුනිතා රත්නායක මහත්මියගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඇය තමා අතින් සිදු වී ඇති අතපසු වීම පිළිගෙන ඇත.

ප්‍ර - දෙපාර්ශ්වය විසින් එකඟතාවය පිළිගෙන ගිවිසුමක් අත්සන් කළාද ? 12.1 වගන්තිය යටතේ අවශ්‍යා නේද?12.1 වගන්තිය යටතේ?

පි- අවශ්‍යායි නමුත් මම ස්ථාන මාරු වී ගිය නිසා මට ඒක කරගන්න බැරි වුනා අන්තිම තීරණය තිබෙන්නේ දෙසැම්බර් 24.

ප්‍ර - ඔබතුමිය කලින් වතාවේ ප්‍රකාශ කළා වැටුප් ලේඛනය ගරු බේරුම්කාරතුමා ඇසූ පරිදි වැටුප් ලේඛනය අවශ්‍යා නැහැ කියලා 12.1 යටතේ එකඟතාවයක් සඳහා අත්සන් කරන්න. ඔබතුමිය ඒක පිළිගන්නවාද?

පි- පිළිගන්නවා

ප්‍ර - එහෙම නම් ඇයි එකඟතාවයකට පත්වුනේ නැත්තේ.

පි- මට කාලය ප්‍රමාණවත් වුනේ නැහැ. 2018.12.24 අන්තිම දවස තමයි මම පරීක්ෂණය කරලා තිබෙන්නේ. ඉන් ඉදිරියට ඊළඟ නිලධාරියා තමයි එම කටයුතු සිදු කරන්න ඕනේ.

(2024.04.03 සාක්ෂි සටහන් පිටු අංක 07.)

2018.12.24 වන දින පැවති කම්කරු නිලධාරිවරිය විසින් කරන ලද කාර්මික ආරාවුල් පරීක්ෂණයෙන් පසුව ඇයගේ පරීක්ෂණ වාර්තාව සමග ඇයගේ නිර්දේශය තමාගේ ඉහල අධික්ෂණ නිලධාරියාට ඉදිරිපත් නොකිරීමෙන් පෙනී යන්නේ එකී වාර්තාව සත්‍ය වාර්තාවක් ද නැතහොත් තමාට අවශ්‍ය පරිදි පසුව සකස් කරන ලද වාර්තාවක් ද යන්න සැක සහිත බවකි. කම්කරු නිලධාරිවරයෙකු විසින් පරීක්ෂණයක් අවසානයේ සකස් කරන වාර්තාව සහ එහි දක්වා ඇති තමාගේ නිර්දේශ ඉහල අධික්ෂණ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය සහ වැඩිමනක් උපදෙස් වෙතොත් එම උපදෙස් ලබා ගත යුතුව ඇත. නමුත් මෙම නිලධාරිනිය ඒ අනුව කටයුතු කර නැත. සාක්ෂි විභාගයේදි කම්කරු නිලධාරිවරිය ඒ බව පිළිගෙන ඇත.

ප්‍ර- ඔබේ නිර්දේශ අනුමත කිරීම හෝ අනුමත නොකිරීම හෝ වෙනත් උපදෙසක් ලබා දීම සහකාර කම්කරු කොමසාරිස්ගේ වගකීමයි ?

පි- එසේය

ප්‍ර- ඒ නිසා මෙම වාර්තාව සහකාර කම්කරු කොමසාරිස්වරයාට ඉදිරිපත් කරලා නැද්ද?

පි - දෙසැම්බර් 24 ස්වාමිනි මම ජනවාරි 01 වන දින ස්ථාන මාරු වුනා.

ප්‍ර - ගොනුව අනුව කියන්න

පි- ගොනුව අනුව ඒකේ සටහනක් නැහැ.

ප්‍ර- සටහන් පත්‍රය බලන්න. සටහනේ නැත්නම් වාර්තාව ඉදිරිපත් කිරිමක් සිදුවෙලා නැහැ?

පි- එවැනි සටහනක් නැහැ.

(2024.04.03 දින සාක්ෂි සටහන් පිටු අංක.10)

මේ අනුව 2018.12.24 දින පැවති පැමිණිලි පරීක්ෂණයෙන් පසුව කම්කරු නිලධාරිවරිය විසින් සකස් කරන ලද වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳව පූර්ණ විශ්වාසයක් තැබිය නොහැක. එබැවින් එම වාර්තාවේ දක්වා ඇති පරිදි " උපකුලපතිවරයා විසින් අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේය " යන්නට වඩා උපකුලපතිවරයා විසින් තම අත්සනින් යුතුව 2019.06.14 දින කම්කරු නිලධාරිවරයා වෙත එවා ඇති ලිපියේ සඳහන් පරිදි " උපකුලපතිවරයා විසින් අතුකෝරල මහතා පෙන්වන ලද ලිඛිත කරුණු අනුව අතුකෝරල මහතාට පැහැදිලි අසාධාරණයක් සිදු වී ඇත " යන්න පිළිගැනීමට හැකිය.

එබැවින් " අතුකෝරල මහතා විසින් පෙන්වන ලද ලිඛිත කරුණු " සත්‍ය බවට ඔප්පු කරන තාක් කල් ඔහුට පැහැදිලි අසධාරණයක් සිදු වී ඇතැයි තීරණය කළ නොහැකිය." අතුකෝරල මහතා පෙන්වන ලද " සත්‍ය බව ඔප්පු කිරීමට පළමු පාර්ශ්වය විසින් මෙම නඩුවේ සාක්ෂි විභාගය පුරාවට අසමත්ව ඇත.

2018.12.24 වන දින කම්කරු නිලධාරිවරිය ඉදිරියේ පැවති පැමිණිලි විභාගයේදි සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් "අතුකෝරල මහතාට අසාධාරණයක් සිදු වී ඇති බව " පිළිගන්නා බවට කරන ලදැයි කියන ප්‍රකාශය සත්‍ය වශයෙන්ම කරන ලද ප්‍රකාශයක් බව ඔප්පු කිරීමට පළමු පාර්ශ්වය විසින් තවදුරටත් උත්සාහ ගැනිම සඳහා සාගර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති තිලක් ධර්මරත්න මහතා කැඳවීමට අවසර ඉල්ලා සිටි බැවින් ඊට ද අවසර දුනිමි. ඒ අනුව උපකුලපතිවරයා විසින් 2024.04.03 වන දින සාක්ෂි ලබා දුන් අතර තමන් 2018.12.24 වන දින කම්කරු කාර්යාලයේ පැවති පරීක්ෂණයේදි කරන ලද ප්‍රකාශයක් වන " අතුකෝරල මහතාට පැහැදිලි අසාධාරණයක් සිදු වී ඇති බවටත් ඒ පිළිබඳ කරුණු විශ්වවිද්‍යාල පාලක සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගෙන කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරමි " යන ප්‍රකාශය සම්බන්ධයෙන් පළමු පාර්ශවය විසින් සාක්ෂිකරුගෙන් මෙදින කිසිදු විමසීමක් කළේ නැත. වැඩිදුරටත් සාක්ෂි විමසීම සඳහා 2024.04.29 දිනට සාක්ෂි විභාගය කල් තබන ලදි. 2024.04.29 දින පළමු පාර්ශ්වයේ නියෝජිත මහතා සාධාරණ හේතුවක් නොදක්වමින් සාක්ෂි විභාගය සඳහා පෙනී සිටියේ නැත. සාක්ෂිකරුට ද නොපැමිණෙන ලෙස දැන්වූ බවද අතුකොරල මහතා විසින් කියා සිටි. මෙදින සාක්ෂිකරු වන හිටපු උපකුලපතිවරයාගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබූ නමුත් එය කළ නොහැකි විය. මෙලෙස පිළිගත හැකි හේතුවක් නොමැතිව සාක්ෂි විභාගය මග හැරිය හෙයින්ද සාක්ෂි ලබා දුන් පළමු දින පළමු පාර්ශ්වය විසින් සාක්ෂිකරුගෙන් විමසා සිටිය යුතු කරුණු සම්බන්ධයෙන් විමසා නොසිටි බැවින් ද මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම ද නිෂ්පල බැව් පෙනී ගිය හෙයින්ද කාර්මික ආරවුල් පනතේ නියෝග අංක 28 ප්‍රකාරව කටයුතු කිරීමට තිරණය කළෙමි. දෙපාර්ශ්වයෙන්ම තවත්සක්ෂිකරුවන් ඉදිරිපත් නොකරන බව දැන්වීය.ඒ අනුව සාක්ෂි විභාගය අවසන් කර 2024.05.28 දිනට අවසන් ලිඛිත ප්‍රකාශ කැඳවීමට දෙපාර්ශ්වයේ එකඟතාව මත නියම කළෙමි.

නිගමන

1. ඒ. කේ. ඩී. ජී. අතුකෝරල මහතා සහ පී. එස්. ජේ. රත්නායක මහතා විසින් සම්මුඛ පරීක්ෂණ යේ ලකුණු වෙනස් කිරිමට

පෙර ලකුණු 75 බැගින් වූ සමාන ලකුණු ලබා ඇත. ඒ අනුව ඒ. කේ. ඩී. ජී. අතුකොරල මහතා ප්‍රමුඛ ස්ථානයට ලකුණු ලබා තිබුනේ යැයි ඔහු විසින්ම කියා සිටීම සාවද්‍ය ප්‍රකාශයකි.

2. සම්මුඛ පරීක්ෂණයට පසුදින සභාපතිවරයාගේ නිල කාමරයේදී ඒ.කේ. ඩී. ජී. අතුකොරල මහතා සහ පී. එස්. ජේ. රත්නායක මහත්වරු ඉදිරිපිටදීම ඔවුන් අධ්‍යාපන සුදුසුකම් වෙනුවෙන් ලබා තිබූ ලකුණු 30 බැගින් වූ සමාන ලකුණු ප්‍රමාණයන් සභාපතිවරයා විසින් පෑනකින් කපා ඔවුන් දෙදෙනා සඳහා පිළිවෙලින් ලකුණු 17 ක් සහ ලකුණු 10 ක් ලෙස වෙනස් කර ඇති බවත් ඒ අනුව දෙදෙනා ලබා ඇති මුළු ලකුණු ප්‍රමාණය පිළිවෙලින් 62 හා 55 ලෙසද වෙනස් කර ඇති බවටත් ඒ.කේ.ඩී.ජී.අතුකොරල මහතා විසින් චෝදනා කරයි. එම චෝදනාව සනාථ කිරීමට කිසිදු ලිඛිත හෝ වාචික සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ඒ. කේ. ඩී. ජී. අතුකොරල මහතා අසමත්වී ඇත.

3. එබැවින් එම ලකුණු වෙනස් කිරීම සිදු කර ඇත්තේ 2003.10.01 වන දින සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම බවට තීරණය කිරීමට සිද්ධිමය වශයෙන් වැඩි බර සම්භාවිතාවයක් පවතී.

4. ඉහත ලකුණු වෙනස් කිරීම සම්බන්ධයෙන් එකම සජීවී සාක්ෂිකරුවන් දෙදෙනා වන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ හිටපු සභාපතිවරයා සහ පී.එස්.ජේ. රත්නායක යන අය එම ආයතනයේ සේවය අවසන් කර ඉවත්ව ගොස් සෑහෙන කාලයකට පසු ආයතනය තුළ ලිඛිත හෝ වාචික සාක්ෂියක් නොමැති පසුබිමක් තුළ ආයතනයට අළුතින් පත්ව ආ නව සභිපතිවරයාගෙන් අතුකොරල මහතා සාධාරණයක් ලබා ගැනීමට අසාර්ථක උත්සහයක යෙදී ඇත. එනම් සියලු සාක්ෂි මැකී ගිය පසු අතුකොරල මහතා සාධාරණය ඉල්ලා සිටීම පල රහිත වී ඇත.

5. රත්නායක මහතා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවය කිරීම කිසියම් හෝ විටෙක අවසන් කළද සභාපතිවරයා විසින් අතුකොරල මහතා සමඟ එකඟතායකට පත්වූවා යැයි කියන පරිදි රත්නායක මහතා දැරූ අධ්‍යක්ෂක (පාලන හා මුදල්) තනතුරට අතුකෝරල මහතා පත් කිරීමට සභාපතිවරයාට බලයක් නැත. ඔහුට කළ හැකි වනුයේ ආයතනය තුළ පවත්නා බඳවා ගැනිම පටිපාටිය අනුව පුවත්පත් දැන්වීමක් මඟින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සෙකු තෝරා ගැනීම විනා අතුකෝරල මහතාට එම පත්වීම ලබා දීම නොවේ.

6. 2003.10.01 වන දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසුව එවකට පැවති ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සභාපතිවරයා විසින් එම සම්මුඛ පරිකෂණයේදි ලබා දී තිබූ ලකුණු වෙනස් කිරීමක් නිසා අතුකෝරාල මහතාට අසාධාරණයක් සිදුව ඇති බව තමන් පිළිගන්නා බව සාගර විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා විසින් 2018.12.24 වන දින කම්කරු කාර්යාලයේ පැවති පැමිණිලි විභාගයේදී පිළිගත්තේ යැයි පැමිණිලි පරීක්ෂණ වාර්තාවේ දක්වා තිබීම, උපකුලපති විසින් කරන ලද ප්‍රකාශය විකෘති කොට දැක්වීමක් බව ලිඛිත සාක්ෂි මඟින් අනාවරණය වී ඇත.

7. 2015.06.17 දින අතුකොරල මහතා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සිට සාගර විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදි 2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ 70, 71 වගන්ති ප්‍රකාරව අනුරූප තනතුරක් සඳහා අර්පණය කිරීමෙන් පසු අතුකොරල මහතා විසින් එම අර්පණය ප්‍රතිග්‍රහණය කිරිම හා තනතුරට ඔහු පත් කිරීමෙන් පසු යම් අසාධාරණයක් වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අභියාචනා කටුවකට අභියාචනය කිරීමේ අවස්ථාවක්ද ලබා දී ඇත. නමුත් අතුකොරල මහතා විසින් තමන් වෙත අර්පණය කරන ලද තනතුර වැරදි බවට අභියාචනයක් කර නැත. ඒ අනුව මෙම අන්තරග්‍රහණය කිරීමේදී අතුකොරල මහතාට අසාධාරණයක් සිදුව නැත.

**ප්‍රදානය**

01. ඒ.කේ. ඩී. අතුකෝරල මහතා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ගණකාධිකාරිවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2003.10.01 දින පැවති අධ්‍යක්ෂ (පාලන හා මුදල්) තනතුර සඳහා බඳවා ගැනීමේ දී ඔහුට අසාධාරණයක් සිදුවී නැත.

02. 2015.06.17 වන දින ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සිට සාගර විශ්වවිද්‍යාලයට අන්තරග්‍රහණය කිරීමේ දී ඒ. කේ. ඩී. ජී. අතුකොරල මහතාට 2003.10.01 දින පැවති අධ්‍යක්ෂක (පාලන හා මුදල්) තනතුර සඳහා බඳවා ගැනීමේදී සිදු වූයේ යැයි කියන කිසිදු සිද්ධියක් හේතු කොට ගෙන අසාධාරණයක් සිදු වී නැත.

03. මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

එම්. එම්. අයි. ආර්. ඒ. ජයතිලක,
බේරුම්කරු.

2024 දෙසැම්බර් මස 02 වැනි දින.

EOG 01-0017

---

මගේ අංකය IR/COM/04/V/2015/94

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.05 දිනැති හා අංක 2135/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, තල්වත්ත, හේවාහැට පාර, අංක 71/4 හි පදිංචි ආර්. යූ.එම්.එස්. රාජකරුණා මහතා සහ කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/70/2019 හා 2024.11.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස්.

2024 දෙසැම්බර් 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

නඩු අංකය: A /70/2019

යොමු අංකය :-IR/COM/04/V/2015/94

R.U.M.S.රාජකරුණා මයා
ලිපිනය: 71/4,
හේවාහැට පාර
තල්වත්ත,
මහනුවර,

පළමු පාර්ශ්වය.

එදිරිව

ශ්‍රීලංකා ගමනාගමන මණ්ඩලය,
අංක:200, කිරුල පාර,
කොළඹ 05.

දෙවන පාර්ශ්වය.

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා ) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධික මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.02.24 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුලට තුඩු දුන් කාරණය:-

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික අරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2019.ජුලි 14 වන දිනැතිව ඒවා ඇති ලිපියේ දැක්වෙන්නේ

" ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ යටිනුවර ඩිපෝවේ සේවය කරන ආර්.යූ.එම්.එස් රාජකරුණා මහතාට මහනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමනාකාරගේ අංක මබස/සේමකො /පා /01/2004 හා 2004.01.29 දිනැති ලිපිය මගින් ලබාදී තිබූ වැටුප් වර්ධක මහනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමනාකාරගේ අංක: මබස/සේමකො/පා/04/2004 හා 2004.06.21 දිනැති ලිපිය මගින් අඩු කිරීම යුක්ති සහගතද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ. ‘‘

පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය:-

මෙම නඩුවේ විභාගය ආරම්භ වීමට පෙර දෙපාර්ශ්යේම ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවසර ලබාදුන් අතර ඒ අනුව දෙපාර්ශ්වයම තම ලිඛිත ප්‍රකාශන බේරුම්කරණ වෙත ඉදිරිපත් කර ඇත. ඉන්පසු දෙපාර්ශ්වය අතර මේ සම්බන්ධයෙන් සමථයක් තිබේද යන්න සලකා බැලූ අතර වග උත්තරකාර පාර්ශ්වය පූර්ණ සහ අවසාන ගෙවීමක් ලෙස පැමිණිලිකරුට රු. :15000.00 මුදලක් ගෙවා සමථයකට එළඹීමට යෝජනා කළ ද, පැමිණිල්ල ඒ සඳහා එකඟත්වයකට පත් නොවූයෙන් මෙම නඩුව විභාගයට ගන්නා ලදී.

ඉල්ලුම්කාර පාර්ශ්වය සිය පළමු ප්‍රකාශය 2019 .08. 26 දින ඉදිරිපත් කර ඇති අතර ප්‍රකාශ කර ඇත්තේ ඔහු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ යටිනුවර ඩිපෝවේ සේවය කරන අතරතුර මහනුවර බස් කම්පැනි ලිමිටඩ්හි සේවක මණ්ඩල කළමනාකරණ තැනගේ අංක මබස/සේවකො/පා/04/2004 හා 2004.01.29 දිනැති ලිපිය මගින් ලබාදී ඇති වැටුප් වර්ධක මගනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමණාකාර තැනගේ අංක මබප/සේවකො/පා/04/2004 හා හා 2004 .06.21 දිනැති ලිපිය මගින් අඩු කිරීම සාධාරණ නොවන බවත් සහ එකී වැටුප් වර්ධකවල හිග මුදල් සහ වෙනත් සහන ලබාදෙන ලෙසත්ය.

වග උත්තරකාර පාර්ශ්වය සිය ලිඛිත ප්‍රකාශනය 2019.08.27 දින ඉදිරිපත් කර ඇත. ඒ අනුව මේ නඩුව වසර 15 කට පසුව ගොනු කර ඇති බවට මූලික විරෝධතා ඉදිරිපත් කර ඇත. මීට අමතරව මෙම ඉල්ලුම්කරු 1999 වර්ෂයේ බස් කොන්දොස්තර තනතුරට පත් වූ බවත් 2022.09.20 දිනැති ලිපියෙන් ඩිපෝ පරීක්ෂක තනතුරට පත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඊට අමතරව 2023 .07.28 දිනට ඉහත උසස් වීම් නතර කර ඇති බවත් එමෙන්ම 2015 මුදල් වංචාවක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඇති බවද ප්‍රකාශ කර ඇත.

තවද ඉල්ලුම්කරු ඉල්ලුම්කර ඇති වැටුප් වර්ධක ලබා ගැනීමට නීත්‍යානුකූල හැකියාවක් නොමැති බවද ප්‍රකාශ කර ඇති අතර 2004.06.21 දිනැති ලිපියෙන් වැටුප් වර්ධක අඩු කර ඇති බවද ප්‍රකාශ කර ඇත.

තවද 2019 සැප්තැම්බර් මස 25 වන දින වග උත්තර පාර්ශ්වය ඉල්ලුම්කරුගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම නඩුවේ ඉල්ලුම්කරු වන R.U.M.S. රාජකරුණා යන අයට ලබාදී තිබූ වැටුප් වර්ධක 2004 .06.21 දිනැති ලිපියෙන් අඩුකර ඇත්තේ ප්‍රතිපත්තිමය තීරණයක් මත බවත් එමගින් වැරදි ආකාරයට වැඩිකර තිබූ වැටුප් වැඩිකිරීම් නිවැරදි කර ඇති බවත්ය. ඉල්ලුම්කරුට පමණක් නොව මෙම නිවැරදි කිරීම තවත් සේවකයන්ටද බලපා ඇති බවත්ය. තවද මෙම සිද්ධිය සිදුවී වසර 14 කට පසු නඩු පැවරීම සිදු කර ඇති හෙයින් මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභා විය යුතු බවත්ය.

පළමු පාර්ශ්වය 2019 ඔක්තෝබර් මස 07 දින ප්‍රකාශයක් කරමින් තමන්ට අහිමි වූ උසස් වීමක්ද කම්කරු විනිශ්චය සභාවේ මැදිහත්වීම මත නැවත ලැබුණු බව ප්‍රකාශ කර ඇත. තවද හතර වැනි කරුණ සම්බන්ධයෙන් කියා සිටින්නේ තමන්ට දැඩි දඩුවම් පමුණුවා නොමැති බවත් තරයේ අවවාද කිරීමක් පමණක් කර ඇති බවත්ය. කෙසේ වුවද වැටුප් වර්ධක 5ක් අහිමි කිරීම යුක්ති සහගත නොවන බවද ප්‍රකාශ කර ඇත.

දෙපාර්ශ්වයේම ප්‍රකාශන ලබා ගැනීමෙන් පසුව මෙම නඩුව 2019.12.03 දින විභාගයට ගන්නා ලද අතර වග උත්තරකාර පාර්ශ්වය නොපැමිණීමෙන් නැවත නඩු විභාගය 2020.01.14 දිනට නියම විය.

2020 .01. 14 දින නැවත නඩුව විභාගයට ගන්නා ලද අතර දෙපාර්ශ්වයම පැමිණෙන ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වය තම කරුණු ඉදිරිපත් කරමින් තමන් සතු ලේඛන අස්ථාන ගත වූ බවත් එකී ලේඛන පිටපත් වග උත්තරකාර පාර්ශ්වයෙන් ඉල්ලා ඉදිරිපත් කර නඩු විභාගය සඳහා පැමිණීමට වෙනත් දිනයක් ඉල්ලා සිටින ලදී. මෙහිදී දෙපාර්ශ්වය අතර සමථයක් පවතින්නේ ද යන්න පිළිබඳව

විමර්ශනය කළ අතර සමථයක් ඇති නොවූයෙන් මෙම නඩුව විභාගය හෝ සමථය සඳහා නැවත 2020.03.04 දිනට නියම කරන ලදී.

2020.03.04 දින වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥවරිය සමග වග උත්තරකාර පාර්ශ්වයේ නීතිඥවරිය ද පැමිණ සිටි අතර ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත නොපැමිණි හෙයින් නැවත දිනයක් ඉල්ලා සිටී. ඉදිරි දිනයේ දී ඉල්ලුම්කාර පාර්ශ්වය උනන්දුවක් නොදක්වන්නේ නම් මෙම නඩුව විභාගයට ගැනීම අත් හිටුවන මෙන් වග උත්තරකාර පාර්ශ්වය ඉල්ලා සිටී. මේ අනුව ඉදිරි දින තම නියෝජිත මහතාද සමඟ නඩු විභාගයට සූදානම්ව පැමිණෙන මෙන් වග උත්තරකරුට අවවාද කලෙමි.

ඒ අනුව නැවත විභාගය 2020 .04.30 දිනට නියම කරන ලදී. කෙසේ වුවද රටේ පැවතී කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නඩු විභාගය නැවත 2020.09.02 දිනට නියම විය.

ඉල්ලුම්කරුගේ නඩුවට අදාළ ලියකියවිලි තම නියෝජිත මහතා වෙතින් අස්ථානගතව ඇති හෙයින් තමන් ගරු බේරුම්කරණය මගින් එකී ලේඛන වග උත්තරකාර පාර්ශ්වයෙන් ඉල්ලා සිටිය ද මෙතෙක් නොලැබුණු බැවින් එය ලබාදෙන මෙන් නැවත ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව එකී ලේඛනවල සහතික පිටපත් ඉල්ලුම්කරුට ලබාදෙන මෙන් වග උත්තරකාර පාර්ශ්වයට නියෝග කරන ලදී. මේ අනුව මෙම නඩුව නැවත විභාගයට ගැනීම 2020.11.11 දිනට නියම කරන ලදී.

**සාක්ෂි සම්පිණ්ඩනය**

රටේ පැවති ප්‍රවාහන අර්බුදය මත මෙම නඩුව නැවත විභාගය නියමිත දිනට සිදු නොවූ අතර නැවත විභාගය 2021.03.10 දිනට නියම විය. මෙදින දෙපාර්ශ්වයම පෙනී සිටි අතර ඉල්ලුම්කරුගෙන් මූලික සාක්ෂි විමසීමද සිදු විය.

මෙහිදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන් 1999.12.15 සිට අනියම් කොන්දොස්තර තනතුරට පත් වූ බවත්, 2000 වර්ෂයේ පමණ එය ස්ථිර වූ බවත් 2002.09.01 සිට ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට පත්ව මහනුවර යටිනුවර ඩිපෝවේ සේවය කළ බවත්ය. තවද 2004 .02.01 සිට ක්‍රියාත්මක වන පරිදි 2004 01.29 දිනැති සේවක මණ්ඩල කළමනාකාර තැනගේ ලිපිය මගින් වැටුප් වර්ධක 05 ක වැඩිවීමක් සිදු වූ බවත්, එය 2004. 02..01 සිට 2004 අප්‍රේල් දක්වාම ගෙවූ බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව වැටුප් වර්ධක 05 ක එකතුව වශයෙන් රු 110/= ක් තමන්ට ලැබුණු බව ද ප්‍රකාශ කර ඇත. එකී වැටුප් වර්ධක ලැබීම 2004 මැයි සිට තමන්ට නොදන්වා අහිමිකර ඇති බවත්, ඒ පිළිබඳව තමන් ඩිපෝ කළමනාකාර තැනගෙන් විමසීමේදී එසේ අහිමි කිරීම ඉහල පරිපාලනයේ උපදෙස් මත සිදුකර ඇති බව දැන්වූ බවද ප්‍රකාශ කර ඇත.

තවද එසේ ඉවත් කිරීමට හේතුවක් දක්වා නොමැති බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව තමන් තම වෘත්තීය සමිතියේ අනුග්‍රහය ඇතිව කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් ගොනු කළ බවද, එකී වැටුප් වර්ධක ගෙවන මෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් නියෝග කර ඇති අතර 2004.09.16 දින දරන එකී ලිපිය A 2 ලෙස සලකුණු කරමින් ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද මෙම වැටුප් වර්ධක නියමිත පරිදි නොගෙවූ හෙයින් තම වෘත්තීය සමිති දිස්ත්‍රික් නියෝජිත මගින් මේ පිළිබඳව දිගින් දිගටම ඉල්ලීම් කිරීමට කටයුතු කළ බවත්, එහිදී එකී දිස්ත්‍රික් නියෝජිතට එනම් ඩී. විමල සේන යන අයට පමණක් මෙම ගෙවීම කිරීමට පරිපාලනය විසින් කටයුතු කර ඇති බව තමන් අනාවරණය කරගත් බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව තමන්ද නැවත මේ පිළිබඳව ඉල්ලීම් කළ අතර කම්කරු දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව පරීක්ෂණ කිහිපයක් සිදු කළද එහි ප්‍රතිඵලයක් නොවූයෙන් මෙම පැමිණිල්ල කාර්මික අධිකරණය වෙත නැවත යොමුකර ඇති බව ද ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද මෙම අහිමි කිරීම 2004 මැයි මස සිට ක්‍රියාත්මකව 2016 දෙසැම්බර් දක්වා පැවති බවත් නැවත එය ගෙවීම 2017 වර්ෂයේ ජනවාරි වලින් ආරම්භව මේ දක්වාම සිදු කෙරෙන බවටත් සිය සාක්ෂිය තුළින් තහවුරු කර ඇත. ඒ අනුව 2014 මැයි 01 සිට 2016 දෙසැම්බර් 31 දක්වා තමන්ට අහිමිකළ වැටුප් වර්ධක ලබා දෙන මෙන් වැඩි දුරටත් ඉල්ලා සිටී. 2021 .04 .07 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේ දෙපාර්ශයම පැමිණ සිටි අතර පැමිණිලිකරුගෙන් වැඩිදුර මූලික සාක්ෂි විමසීම සිදු කරන ලදී.

ඉල්ලුම්කරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ 2004 මාර්තු මස සිට 2004 අප්‍රේල් මස දක්වා තමන්ට ගෙවා ඇති වැටුප් වර්ධක 2004 මැයි සිට නතර කර ඇති බවයි. 2004 වර්ෂයේ ඉල්ලුම්කරු වෙනුවෙන් නඩත්තු වී ඇති වර්යා සටහන් පිටපතක් A 4 වශයෙන් ලකුණු කර අතර මාර්තු වැටුප A 4 (a) ලෙසද, අප්‍රේල් වැටුප A4 (b) ලෙසත් සලකුණු කර සිටී.

ඒ අනුව වැඩි වූ වැටුප් වර්ධක 5 සමඟ මාර්තු අප්‍රේල් මස වැටුප වැඩි වී ඇති බව ද අප්‍රේල් මාසයේ වැටුප රු : 4605ක් වුවද මැයි මස වැටුප රු : 4505 දක්වා අඩු වී ඇති බව සඳහන් කරන අතර එයට හේතුව තමන්ගේ 2004 වර්ෂයේ වැඩි වූ වැටුප් වර්ධක 05ක් 2004 වර්ෂයේ අප්‍රේල් මස කපා හැරීම බවත් වැඩි දුරටත් කියා සිටී.

වග උත්තරකාර පාර්ශ්වය ඉල්ලුම් කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපිය ලැබූ දිනය ස්ථිර කිරීම් සහ උසස්වීම් ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවයක් දක්වා නොමැත.

ඉල්ලුම්කරු ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට පත් කළ (2003-2004 කාල සීමාවේ පත්වීම් ලිපිය R 4 වශයෙන් සලකුණු කුණු කර ඉල්ලුම්කරුගේ සාමාන්‍ය වැටුප් වර්ධක ලැබීම් සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්ණ කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ දිගින් දිගටම තමාට වැටුප් වර්ධක ක්‍රමානුකූලව ගෙවා ඇති බවය. තවද p 35 form පත පුරවා ඒ අනුව වැටුප් වර්ධක හෙවන බව ද ඉල්ලුම්කරු පිළිගෙන ඇත. එහෙත් ඒ පිළිබඳව විශේෂ දැනුමක් මුල් කාලයේ සිට තමන්ට නොවූ බවද, තමන් ඉහල නිලධාරියකු මට්ටමට පැමිණි විට පමණක් p 35 form එකක් ලබා ගැනීමෙන් පසු පඩි වැඩි වූ බව තමන් දන්නා බවත් වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තවද වැටුප් වර්ධක ලබාදීමට පෙර form 35 ලේඛනය මගින් වාර්ථාවක් ලබා ගන්නා බව තමන් දන්නා බවද ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. කවද 2004 පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි සඳහා වැටුප් වර්ධක 05 ක් ගෙවීමට අනුමැතිය ලැබුණද ඒ පිළිබඳව form 35 ලේඛනය ඉදිරිපත් කර අනුමැතිය ගත්තේද යන්න තමන් නොදන්නා බව ඉල්ලුම්කරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

අමතර වැටුප් වර්ධක නොලැබීම සම්බධයෙන් ඉල්ලුම්කරුගෙන් වග උත්තරකාර පාර්ශ්වය ප්‍රශ්න කළ අතර ඒ අනුව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තම අමතර වැටුප් වර්ධක නතර කිරීම සම්බන්ධයෙන් තමන් ඉහල පාලන අධිකාරියට දන්වා සිටියද, විසඳුමක් නොවුයෙන් කම්කරු කාර්යාලයට තම පැමිණිල්ල යොමු කළ බවයි.

පැමිණිල්ල විභාග කොට එකී වැටුප් වර්ධක ගෙවන මෙන් වගඋත්තරකාර පාර්ශ්වයට දැක්වුවද එකී නියෝග ක්‍රියාත්මක කිරීමට වග උත්තරකරු අපොහොසත්ව ඇති බැවින් තමන් තම පැමිණිල්ල බේරුම්කරණය වෙත ඉදිරිපත් කළ බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

බේරුම්කරණය වෙත මෙම පැමිණිල්ල යොමු කිරීමට ප්‍රමාද වීම හේතු විමසු අවස්ථාවේ ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ වෘත්තීය සමිතිය විසින් මේ පිළිබඳව කම්කරු කාර්යාලයේ ගොනු කළ නඩුව අවසන්ව තිබූ බව තමන් නොදැන සිටි බවත් ඉන්පසු එම නඩුවට සම්බන්ධ එක් අයෙකුට පමණක් තමන්ට හා සමානව අත්හිටවා තිබූ වැටුප් වර්ධක ගෙවා තිබූ බව තමන් විසින් දැන ගැනීමෙන් පසු මෙම නඩුව ගොනු කළ බවත් ප්‍රකාශ කර ඇත.

2021.12.03 දින මෙම නඩුව විභාගයට ගත්තද මේ සඳහා සහභාගී වූ රජයේ නීතිඥවරිය ස්ථාන මාරුවක් නිසා නොපැමිණීමෙන් නඩු විභාගය 2022.02.07 දිනට කල් තබන ලදී.

2022.02.07 දින දෙපාර්ශ්වම පැමිණ සිටි අතර ඉල්ලුම්කාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් වැඩි දුර හරස් ප්‍රශ්න සිදු කරන ලදී. මෙහිදී සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා ප්‍රශ්න කරමින් අහිමි කළ වැටුප් වර්ධක ගැන ඔහුට මීට පෙර දන්වා ඇති බව ඒත්තු ගැන්වීමට උත්සාහ ගෙන ඇත. එහෙත් ඉල්ලුම්කරු ප්‍රකාශ කරන්නේ තමන් මෙතෙක් එවැනි ලේඛනයක් නොදුටු බවත් වැටුප් අහිමි කිරීම පිළිබඳව තමන් දැනුවත් නොකළ හෙයින් ඒ පිළිබඳව ඉහල නිලධාරීන්ගෙන් ද විමසා පිළිතුරක් නොවීමෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් ගොනු කළ බවයි.

අවම වශයෙන් දැන්වීම් පුවරුවක හෝ මෙම අහිමි කිරීම පිළිබඳව දැන්වීම් කර නොතිබූ හෙයින් තමන් මේ පිළිබඳව දැනුවත් නොවුනු බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඉල්ලුම්කරුට R. 4 ලේඛනය පෙන්වීමෙන් එකී අහිමි වූ වැටුප් වර්ධක දැනට 2017 වසරේ සිට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍රලේඛනය අනුව ක්‍රියාමක කර ඇති බව ප්‍රකාශ කර සිටී.

ඉල්ලුම්කරුගේ 2018 වර්ෂයට අදාළ වර්යා පත්‍රය R 6 ලෙස ලකුණු කරමින් ප්‍රශ්න විමසීම සිදුකළ අතර ඒ අනුව එකී වර්ෂයේ ජනවාරි මස ඉල්ලුම්කරුගේ වැටුප සාක්ෂි විමසීම තුළින් තහවුරු කර ඇත.

කෙසේ වුවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ තමන්ට 2004 වර්ෂයේ සිට ලබා දී ඉවත් කළ වැටුප් වර්ධක නැවත ලබා නොදුන් බවයි. අවසාන වශයෙන් වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත්තේ ඉල්ලුම්කරු තමන්ට අයකර යුතු හිඟ වැටුප බේරුම් කරණය වෙත ඉදිරිපත් කරන ලෙසයි. ඒ අනුව නොගෙවා ඇති වැටුප් වර්ධකවලින් ලැබිය යුතු හිඟ මුදල් පිළිබඳව වාර්තාවක් වග උත්තරකාර පාර්ශ්වයටද පිටපත් සහිතව අධිකරණ ගත කරන මෙන් ඉල්ලුම්කරුට නියෝග කළෙමි. එලෙස 2022 මාර්තු 30 දින ඉල්ලුම්කරු වග උත්තරකරුවන්ටද පිටපතක් සහිතව ගෙවිය යුතු වැටුප් වර්ධක මුලු හිඟය රු 69110/=ක් ලෙස ගණනය කර ඉදිරිපත් කර ඇත.

2022.02.24 නැවත හරස් ප්‍රශ්න විමසීම සිදු කළ අතර එහිදී ඉල්ලුම්කරු ඉදිරිපත් කර ඇති අවසාන ලේඛනයේ සඳහන් 2017 ජනවාරි සිට වැටුප් වර්ධක තමන්ට ගෙවා ඇති බව ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට මුහුණ දෙමින් ප්‍රකාශ කර ඇත.

නැවත ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ P .35 පෝරමය මගින් සාමන්‍ය වාර්ෂික වැටුප් වර්ධක වැඩි වීමක් සිදු වන බවත් තමන් ඉල්ලා සිටින්නේ එහි හිඟයක් නොව 2004 පාර්ශ්වයේ A 1 ලෙස ලකුණු කර ඇති ලේඛනය හරහා ලබා දුන් වැටුප් වර්ධක 05ක හිඟය බවත්ය.

තවද 2004.06.21 ලිපිය මගින් එනම් R -5 ලේඛනය මගින් තමන්ට ලැබූ විශේෂ වැටුප් වර්ධක 2004 මැයි මස සිට අහිමි කළ බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. මෙම අහිමි කිරීම් පිළිබඳව අවම වශයෙන් දැන්වීම් පුවරු මගින් හෝ සේවකයින් දැනුවත් කර නොමැති බවද ප්‍රකාශ කර ඇත. කෙසේ වුවද තමන්ට 2004 මැයි සිට 2016 දෙසැම්බර් මස 31 දක්වා, 2004 වර්ෂයේ ලබා දුන් විශේෂ වැටුප් වර්ධක ගෙවීම්වල හිඟයක් ඇති බව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

2022.04.27 දින ඉල්ලුම්කරු විසින් නව සාක්ෂිකරුවෙකු කැඳවා ඇති අතර ඔහු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු

ලෙස වසර 39 ක් සේවය කළ පුද්ගලයෙකු බව කියා සිටි. තවද ඩී. විමලසේන වන තමන් වෘත්තිය සමිති ක්‍රියාකරුවෙක් ලෙස සේවය කර බවත්, මෙම පැමිණිල්ලට අදාළ ගැටළුව සම්බන්ධයෙන් තමන්ද කම්කරු දෙපාර්මේන්තුවට කළ පැමිණිල්ලේ පැමිණිලිකරුවකු වන බවත්, තමන්ට එකී වැටුප් වර්ධක ලබා ගැනීමට හැකි වූ බවත් ප්‍රකාශ කර ඇත.

තවද මෙම පැමිණිල්ලට අදාළ ඉල්ලුම්කරු හඳුනන බවත් ඔහු යටිනුවර ඩිපෝවේ සේවකයෙකු බවත් සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. තවද ඉල්ලුම්කරුට වැටුප් වර්ධක 05 ක් ලබා දීමට අදාළව නිකුත් කර ඇති A1 ලේඛනය තමන් දුටු බවද වෘත්තිය සමිති නියෝජිතවරයෙකු ලෙස කටයුතු කිරීමේදී එකී වැටුප් වර්ධක අහිමි වූවන්ගේ ලේඛනය තමන් විසින් ලබාගෙන ඒ පිළිබඳව දැනුවත් වූ බවද ප්‍රකාශ කර ඇත.

A 2 ලේඛනය මගින් කම්කරු කොමසාරිස්වරයා විසින් වග උත්තරකාර ආයතනය දැනුවත් කර ඇති බවත්, ගෙවන ලද වැටුපක් කිසි ලෙසකටවත් අඩු කළ නොහැකි බව දන්වමින් එකී මුදල ගෙවන ලෙස දන්වා ඇති බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. 2022.05.27 දින මෙම නඩුව නැවත කැඳවූ අවස්ථාවේදී දෙපාර්ශ්වයම පැමිණ සිටි අතර වග උත්තරකාර පාර්ශ්වය සමථ යෝජනාවක් ගෙන එමින් සමථයක් ලෙස රු. 15000ක මුදලක් ගෙවීමට තමන් කැමති බවත් එය ලබාගෙන සමථයකට පත් වන මෙන් ඉල්ලුම්කාර පාර්ශ්වයට දක්වන ලදී. කෙසේ වුවද ඉල්ලුම්කරු ඒ පිළිබඳව සලකා බලා පසුව සමථයකට පත්වේනම් තම ගණනයන් ඉදිරිපත් කිරීමට කැමති බව දන්වන ලදී.

මේ අනුව පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුවිය. එහිදී 2004 සිට ක්‍රියාත්මක වැටුප් වර්ධක ලබා දීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළ අතර එය ගෙවන මෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් කරන ලද දැන්වීම නියෝගයක් නොවන බවට අභියෝග කර ඇත. එහෙත් එය නියෝගයක් බවට සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

2022.10.07 දින මෙම නඩුව විභාගය සඳහා නැවත කැඳවූ අවස්ථාවේ දෙපාර්ශ්වයම ඒ සඳහා පෙනී සිට ඇත. මෙහිදී වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුවෙකු ලෙස සහකාර කළමනාකාර (මුදල්) යන අය සාක්ෂියට කැඳවා ඇත. එහිදී සාක්ෂිකරු පැමිණිලිකරු රාජකාරී මට්ටමින් හඳුනන බව ප්‍රකාශ කර ඇති අතර ඔහුට සාමාන්‍ය වැටුප් වර්ධකවලට වඩා වෙනස් වූ විශේෂ වැටුප් වර්ධක ගෙවා ඇති බවට පිළිගෙන ඇත. තවද එය 2004 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වූ බවද වැඩි දුරටත් කරුණු දන්වා ඇත. තවද එලෙස ගෙවීම් කිරීමට තීරණය කරන ලද්දේ ලංකා පොකුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බවටද වැඩි දුරටත් කරුණු දක්වා ඇත.

මෙම ගෙවීම් පිළිබඳව ඩිපෝ කළමණාකාර හරහා සේවකයන් දැනුවත් කර ඇති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරුටද ඒ බව දන්වා ඇති බවද ප්‍රකාශ කර ඇත. මෙම වැටුප් වර්ධකය ඩිපෝ 07ක සේවකයන් සියයකට වැඩි ප්‍රමාණයකට ගෙවා ඇති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. 2004 මැයි මසට පසුව මෙම වැටුප් වර්ධක ගෙවීම නතර කර සාමාන්‍ය වැටුප් වර්ධක ගෙවීමට එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩලය R 5 ලේඛනය මගින් තීරණය කර ඇති බවත් කෙසේ වුවද 2017 ජනවාරි සිට එකී විශේෂ වැටුප් වර්ධකය නැවත ගෙවීමට තීරණය කර ඇති බවද ප්‍රකාශ කර ඇත.

තවද එලෙස 2017 ජනවාරි මස සිට එකී වැටුප් වර්ධක නැවත ගෙවීමේදී 2004 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට හිඟ වැටුප් රහිතව ගෙවීමට තීරණය කර ඇති බවද සාක්ෂිකරු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරු විසින් R 4 ලේඛනය ලකුණු කරමින් මේ බව තව දුරටත් තහවුරු කර ඇත.

තවද සාක්ෂිකරු R 6 ලේඛනය පෙන්වා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ මෙම නඩුවේ පැමිණිලිකරුට 2017 ජනවාරි සිට 2018 පෙබරවාරි දක්වා කාලයට අදාළව හිඟ වැටුප් වර්ධක ගෙවා ඇති බවයි.

ඉල්ලුම්කරු සිය ඉල්ලුම් පත්‍රයෙන් ඉල්ලා ඇති පරිදි 2004 මැයි සිට 2018 පෙබරවාරි දක්වා හිඟ වැටුප් වර්ධක ගෙවීමට නොහැකි බවත් එයට හේතු වන්නේ

i. ඉල්ලුම්කරුට 2017 ජනාවාරි සිට 2018 පෙබරවාරි මාසය දක්වා හිඟ වැටුප් ගෙවා ඇති හෙයින්ද,

ii. 2004 මැයි සිට 2016.12.31 දක්වා කාලයට අධ්‍යක්ෂ මණ්ඩලය අත්හිටවූ චක්‍ර ලේඛනයන් අනුව ඉල්ලුම්කරුට හිඟ වැටුප් හිමිකමක් නොමැති බවත් යන්නය.

අධිකරණයෙන් ප්‍රශ්න කිරීමේදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ එසේ වැටුප් වර්ධක නතර කිරීමට පාදක වූ කරුණක් ගැන තමා නොදන්නා බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැටුප් වර්ධක නතර කිරීමට විශේෂ හේතුවක් තමා නොදන්නා බවත්ය.

2022.11.03 දින මෙම නඩුව නැවත කැඳවූ අතර A.9 ලේඛනය ඔප්පු කිරීමේ භාරයෙන් ඉවත් කර ඇත.

මෙදින වග උත්තරකාර පාර්ශ්වයගේ සාක්ෂිකරු ප්‍රසන්න මහතා (වත්තෙගම් ඩිපෝවේ සහකාර කළමනාකාර මුදල්)ගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු කරන ලදී. මෙහිදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ සාමාන්‍ය වැටුප් වර්ධක සාමාන්‍ය පරිදි ගෙවන බවත් තෝරාගත් සේවක කොට්ඨාසයකට විශේෂ වැටුප් වර්ධක ගෙවන බවත්ය. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව විශේෂ වැටුප් වර්ධක ගෙවන බවත් එවැනි තීරණ නීත්‍යානුකූල නිගමන වන බවත් සාක්ෂිකරු වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

ප්‍රශ්නය : විශේෂ වැටුප් වර්ධක ගෙවීම කුමන පදනමක් යටතේද ගෙවන්නේ කියලා කිව හැකිද?
පිළිතුර : අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව.
ප්‍රශ්නය : යම්කිසි ප්‍රාදේශීය කාර්යාලයක් හෝ සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගත්තා නම් එය නීත්‍යානුකූල නිගමනයක් වෙනවාද?
පිළිතුර : ඔව්.

සාක්ෂිකරු A 1 නැමැති ලේඛනය පෙන්වා දෙමින් ප්‍රකාශ කර සිටින්නේ එය R.S.M. රාජකරුණා යන අයට නිකුත් කර ලේඛනයක් බවත් 2007.01.29 නිකුත් කර ඇති එම ලේඛනයෙන් ඉල්ලුම්කරුට විශේෂ වැටුප් වර්ධක 05 ක් ගෙවීමට නියම කර ඇති බවත්, එය A 1 ලේඛනය මඟින් නීත්‍යානුකූල සිදුවූ දෙයක ප්‍රතිඵලයක් බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

මේ අනුව පැමිණිලිකරුට විශේෂ වැටුප් වර්ධක ගෙවා ඇති බවත් එය අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත ගෙවා ඇති බව හා එය නීත්‍යානුකූල බව විත්තියේ සාක්ෂිය මතම පිළිගෙන ඇත.

කෙසේ වුවද A 1 මඟින් ලබාදුන් වැටුප් වර්ධක සහ 5 ලේඛනය අනුව 2004 මැයි සිට නතරකර ඇති බවද සාක්ෂිකරු සිය සාක්ෂියෙන් පිළිගෙන ඇත. තවද 2004 මැයි සිට නතරකර ඇති බවද සාක්ෂිකරු සිය සාක්ෂියෙන් පිළිගෙන ඇත. තවද 2004 අප්‍රේල් මාසයේ දේශපාලන බලය වෙනස් වූ බවත් ඒ අනුව ද්වේශ සහගතව මෙම වැටුප් වර්ධකය නතර කර ඇති බවට ඒත්තු ගැන්වීමට පැමිණිලි පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න විමසීමේදී උත්සහ ගෙන ඇත.

2022.11.29 දින වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න විමසීම සිදුකළ අතර එහිදී විශේෂ වැටුප් වර්ධක යනුවෙන් හඳුන්වනුයේ ප්‍රසාද වැටුප් වර්ධකයක් බවත් තෝරාගත් පිරිසකට පමණක් එය ලබාදී ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂ ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන මෙම වැටුප් වර්ධක ලබාදී ඇති බවද ප්‍රකාශ කර ඇත. තවද එවකට සිටි පොකුරු බස් සමාගම මෙම වැටුප් වර්ධකය ලබාදී ඇති බවද ප්‍රකාශ කර ඇත.

එමෙන්ම වාර්ෂික වැටුප් වැඩිවීම් හැර 2001.12.05 දිනෙන් පසු ලබාදුන් අනෙකුත් වැටුප් වර්ධක සියල්ල නැවැත්විය යුතු බව R 5 ලේඛනයේ සඳහන් බවට සාක්ෂිකාරිය වැඩි දුරටත් සාක්ෂි ලබාදී ඇත. කෙසේ වුවද ලේඛනය අනුව මෙම වැටුප් වර්ධක ගෙවීම් සම්බන්ධයෙන් පූර්ව සහ අවසාන සමථයක් ඇතිව ඇති බවටද සාක්ෂිකාරිය සාක්ෂි ලබාදී ඇත.

2022.12.21 දින වග උත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබා දීම සඳහා ප්‍රාදේශීය මුදල් කළමනාකාර කුමාරි තෙන්නකෝන් මහත්මිය පෙනී සිටින ලදී. මෙම සාක්ෂිකාරිය සිය මූලික සාක්ෂියේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ විශේෂ වැටුප් වර්ධකය යනු ප්‍රසාද වැටුප් වර්ධකයක් බවත්, එය කළමණාකරණයේ අභිමතය හෝ ප්‍රතිපත්තිමය තීරණය මත ගෙවන්නක් බවද, වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. එමෙන්ම මෙම වැටුප් වර්ධක ඉල්ලුම්කරුට පමණක් නොව ආයතනයේ බොහෝ පිරිසකට ලබාදී ඇති බවද ප්‍රකාශ කර ඇත.

තවද මෙම වැටුප් වර්ධකය වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව ලබාදී ඇති බවද, එය ප්‍රසාදයක් වශයෙන් ලබාදෙනු ලබන වැටුප් වර්ධකයක් බවටද සාක්ෂිකාරිය සාක්ෂි දී ඇත. කෙසේ වුවද R 5 ලේඛනය මගින් මෙම ගෙවීම නතර කර ඇති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. තවද මෙම R 5 ලේඛනය මහනුවර බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකාර විසින් නිකුත්කර ඇති ලේඛනයක් බවද ප්‍රකාශ කර ඇත.

2004 වසරේ පෙබරවාරි මස ලබාදුන් සහ එම වර්ෂයේම මැයි මස නතර කළ මෙම වැටුප් වර්ධකය ඉන්පසු 2004 මැයි සිට නතර කර 2017 වර්ෂයේ ජනවාරි සිට නැවත ගෙවීමට තීරණය කර ඇති බවද (වැටුප් වර්ධක නොගෙවූ කාලයට අදාළ හිඟය ගෙවීමකින් තොරව මෙම ගෙවීම සිදුකර ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. තවද මෙම වැටුප් වර්ධක නැවත ගෙවීම R 4 ලේඛනය මගින් සිදුකර ඇති බවද වැඩි දුරටත් කියා සිටී. තවද මෙම නඩුවේ ඉල්ලුම්කරුට R 9 ලේඛනයට අනුව 2018 පෙබරවාරි සිට මෙම වැටුප් වර්ධක නිසි ආකාරයෙන් ගැලපීම් කර ගෙවා ඇති බවද කියා සිටී.

2023.03.10 දින සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකළ අතර, එහිදී R 4 ලේඛනයට අවධාරණය යොමු කරමින් සාක්ෂිකාරිය වැඩි දුරටත් පවසා ඇත්තේ 2004 මැයි මස අහිමිකළ වැටුප් වර්ධක 2017 ජනවාරි මස සිට ආරම්භව නැවත ගෙවීමට ඒකී ලේඛනය අනුව තීරණය වී ඇති බවයි. කෙසේ වුවද 2004 මැයි මස සිට 2017 ජනවාරි දක්වා වැටුප් වර්ධක නැවත ගෙවීමක් සිදු නොවූ බවද ඒකී ලේඛනයේ දක්වා ඇති බව සාක්ෂිකාරිය වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

තවද A1 ලේඛනය මගින් ලබාදුන් වැටුප් වර්ධක R 5 ලේඛනය මගින් අවලංගු කර ඇති බවද සාක්ෂිකාරිය වැඩි දුරටත් සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. තවද ඉහත කී R 5 චක්‍ර ලිපිය මගින් කළ අහිමි කිරීම මානව සම්පත් කළමනාකරු විසින් සිදුකර ඇති බවද ඒ සඳහා ඔහුට බලය ඇති බවද නැවත ප්‍රශ්න විමසීමේදී සාක්ෂිකාරිය විසින් තහවුරු කර ඇත.

2023.06.16 දින වග උත්තරකාර ආයතනයේ සහකාර මානව සම්පත් කළමනාකාරවරිය වන යමුනා දහනායක මහත්මිය සාක්ෂියට කැඳවා ඇත. ඇය විසින් R 5 ලේඛනය ඉදිරිපත් කරමින් සාක්ෂි ලබාදී ඇති අතර, එකී ලිපිය සේවක මණ්ඩල කළමනාකාර මහනුවර බස් කම්පැනි ලිමිටඩ් යන අය විසින් යවා ඇති ලිපියක් බව ප්‍රකාශ කර සිටී. A 1 ලේඛනය මගින් කරුණු දක්වමින් සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත්තේ එමඟින් 2004.02.01 දින සිට විශේෂ වැටුප් වර්ධක 5ක් ලබාදී ඇති බවත් එය දේශපාලන වශයෙන් ලබාදී ඇති බවත්ය.

තවද වාර්ෂික වැටුප් වර්ධක නොවන වැටුප් වර්ධක අහිමි කළ යුතු බව R 5 ලේඛනයේ සඳහන් වන බවට සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත. තවද එකී තීරණය පොකුරු බස් සමාගමෙන් ලබාදුන් තීරණයක් බවද ප්‍රකාශ කර ඇත. ඉන්පසු එකී වැටුප් වර්ධක ගෙවීම හෝ නතර කිරීමේ බලය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරුට පැවරී ඇති බවද, සාක්ෂිකාරියගේ සාක්ෂියේදී අනාවරණය කර ඇත. තවද පසු කාලීනව සේවක ඉල්ලීම් මත මෙලෙස අහිමි කළ වැටුප් වර්ධක (හිඟ වැටුප් රහිතව) 2017 ජනවාරි සිට නැවත ලබාදීමක් කර ඇති බව සාක්ෂිකාරිය ප්‍රකාශ කර ඇත.

R 4 ලේඛනයේ අවසාන ඡේදය අනුව මැතිවරණ කාලය තුළ පසුදාතම් කර දී ඇති නීත්‍යානුකූල නොවන ආකාරයට දී ඇති ඒවා මෙම චක්‍ර ලේඛනයට අනුව ලබා නොදිය යුතු බව, එනම් මෙම චක්‍ර ලිපිය මගින් ලබා නොදිය යුතු අනාවරණය වන බවට සාක්ෂිකාරිය සාක්ෂි දී ඇත. එසේ වුවත් එය නොතකා 2017 ජනවාරි සිට මෙම වැටුප් වර්ධක 5 නැවත ගෙවා ඇති බව සාක්ෂිකාරිය විසින්ම පිළිගෙන ඇත.

සාක්ෂි විශ්ලේෂණය

1. පැමිණිලිකරු විසින් මෙම නඩුව ගොනුකර ඇත්තේ පැමිණිලිකරුට 2004 පෙබරවාරි මාසය තුළ වග උත්තරකාර ආයතනය විසින් ගෙවන ලද විශේෂ වැටුප් වර්ධක 5ක් එම වසරේම මැයි මාසයේ සිට අහිමි කිරීම සහ එකී වැටුප් වර්ධක නැවත 2017 ජනවාරි මාසයේ සිට නැවත ගෙවා තිබුණද, 2004 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා කාලයට අදාළ හිඟ මුදල් නොගෙවීම සම්බන්ධයෙනි.

වග උත්තරකාර පාර්ශ්වය විසින් සිය මූලික ප්‍රකාශය 2019.08.27 දින ඉදිරිපත් කරමින් මෙලෙස වැටුප් වර්ධක අහිමි කළ බව පිළිගෙන ඇති අතර, එය ප්‍රතිපත්තිමය තීරණයක් බවද එමගින් වැරදි ආකාරයට ලබාදී තිබූ වැටුප් වර්ධක අහිමි කිරීමක් සිදුකළ බවද ප්‍රකාශ කර ඇත. මේ අනුව පැමිණිලිකරුට ලබාදී තිබූ වැටුප් වර්ධක අහිමිකිරීමක් සිදුකළ බව වග උත්තරකාර පාර්ශ්වය සිය මූලික ප්‍රකාශය මහින්ම පිළිගෙන ඇති බව දෙපාර්ශවයේම සාක්ෂි මගින් තහවුරු වේ.

2. තවද එලෙස විශේෂ වැටුප් වර්ධක 05ක් ලබාදීමට A1 ලේඛනය මගින් සේවක මණ්ඩල කළමනාකාර, මහනුවර බස් කම්පැනි ලිමිටඩ් යන අයට බලය තිබේද යන්න සාක්ෂි විමසීමේදී සැලකිල්ලට ගෙන ඇති අතර වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුවන සහකාර මානව සම්පත් කලමනාකාරගේ සාක්ෂියේදී තහවුරු වී ඇත්තේ එලෙස A1 ලිපිය සේවක මණ්ඩල කළමණාකාර විසින් නිකුත් කර ඇති බවත් එසේ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඔහුට බලය ඇති බවත්ය.

ප්‍රශ්නය : ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ එවකට පොකුරු බස් තිබෙන කාල වකවානුවේදී වැටුප් වර්ධක ලබාදීමට හෝ අත් හිටුවීමට බලය තිබෙන්නේ කා ළඟද?
උත්තරය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් ගන්නත් පුළුවන්. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සේවක මණ්ඩල කළමණාකරුට ක්‍රියාත්මක කරන්න බලය තියනවා යනුවෙන් සහකාර මානව සම්පත් කලමනාකාරියගේ සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. මේ අනුව A1 මගින් ලබාදී ඇති වැටුප් වර්ධක නිසි බලධාරින් විසින් නීත්‍යානුකූලව ලබාදී ඇති බව තහවුරු වේ. (2023.06.16 සාක්ෂි සටහන් පිටු අංක 4)

3. කෙසේ වුවද වග උත්තරකරුගේ මූලික ප්‍රකාශය තුළින්, මෙම වැටුප් වර්ධක ලබාදීම නීත්‍යානුකූල නොවන බවත්, එබැවින් එය අඩු කිරීම ප්‍රතිපත්තිමය තීරණයක් මත සිදු කළ බව ප්‍රකාශ කර සිටියද එකී ප්‍රතිපත්තිමය තීරණයට සහ නීත්‍යානුකූල නොවීමට පදනම් වූ හේතු සාධක කවරේද යන්න වග උත්තරකාර පාර්ශ්වය සිය මූලික ප්‍රකාශයේදී හෝ සාක්ෂි විමසීම මගින් හෙළිදරව් කර නොමැත.

කෙසේ වුවද 2021.03.10 දින ඉල්ලුම්කරුගෙන් මූලිකන සාක්ෂි විමසීමේදී A1 යටතේ ලබාදුන් වැටුප් වර්ධක අහිමි කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විමසා ඇත.

එහිදී ඉල්ලුම්කරු පවසා ඇත්තේ තමන් ඒ පිළිබඳව ඩිපෝ කළමනාකරු දැනුවත් කළ බවත් එයට හේතු විමසා ඇති බවත් ඩිපෝ කළමනාකරු විසින් එසේ වැටුප් වර්ධක නතර කිරීමට හේතුවක් පෙන්වා දී නොමැති බැවින් මුදල් අධ්‍යක්ෂකගෙන් විමසා ඇති බවත්ය.

පිළිතුර : මම ඒ සම්බන්ධයෙන් ඩිපෝ කළමනාකාරතුමා දැනුවත් කරලා ඉල්ලීම් කරලා නැති නිසා ඒ දුන්න පිළිතුර සෑහීමට පත් වෙන්න බැරි නිසාත් මම මුදල් අධ්‍යක්ෂතුමාට දැනුම් දීමක් කළා.

ප්‍රශ්නය : එයා මොකක්ද කිව්වේ.

පිළිතුර : ඉවත් කරලා තියෙන්නේ කිව්වා

ප්‍රශ්නය : හේතුවක් දැක්වුයේ නැහැ?

පිළිතුර : නැහැ. එයාට දැනුම් දුන්න කියලා තමයි කිව්වේ. (2021.03.10 මූලික සාක්ෂි පිටු අංක 6)

මේ අනුව කිසිදු හේතුවක් නොදක්වා එමෙන්ම කිසිදු පදනමකින් තොරව වග උත්තරකරු විසින් මෙම වැටුප් වර්ධක අහිමිකර ඇති බව තහවුරු වේ.

තවද 2022.10.07 දින වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් මුදල් කළමනාකාර ප්‍රසන්න බොකලවෙල මහතා පෙනී සිටි ඇති අතර විශේෂ වැටුප් වර්ධක අහිමි කළ R 5 ලේඛනය සම්බන්ධයෙන් සාක්ෂි ලබාදී ඇති අතර ඉල්ලුම්කරුට 2004 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා හිඟ වැටුප් වර්ධක ලබාගැනීමේ අයිතියක් නොමැති බව ප්‍රකාශ කර ඇත. වැටුප් වර්ධක නතර කිරීමට හේතුවක් පිළිබඳව තමන් නොදන්නා බවද සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

ප්‍රශ්නය : එයට පාදක වූ කරුණු තිබෙනවාද චක්‍ර ලේඛයකින් එසේ වැටුප් වර්ධක නතර කරන්න?

පිළිතුර : එය දන්නේ නැහැ. අධ්‍යක්ෂ මණ්ඩලය චක්‍ර ලේඛයක් ගසා තිබෙනවා එසේ නතර කරන්න කියලා

ප්‍රශ්නය : විශේෂ හේතුවක් දන්නේ නැහැ?

පිළිතුර : නැහැ (සාක්ෂි සටහන් පිටු අංක 10.11, 2022.10.07)

ඉහත සඳහන් වග උත්තරකරුගේ සාක්ෂිය තුළින්ද පැහැදිලි වන්නේ එලෙස වැටුප් වර්ධක නතර කිරීමට පැහැදිලි හේතුවක් නොමැති බවයි.

04. තවද වැඩි දුරටත් සාක්ෂි දෙමින් පැමිණිලිකරු 2021.03.10 දින ප්‍රකාශ කර ඇත්තේ 2004.02.01 සිට ක්‍රියාත්මක පරිදි 2004.01.29 දිනැති සේවක මණ්ඩල කළමනාකාර තැනගේ ලිපිය මගින් වැටුප් වර්ධක 05ක වැඩිවීමක් සිදුවූ බවත්, එය 2004.02.01 සිට 2004 අප්‍රේල් දක්වාම ගෙවූ බවත් 2004 මැයි මස සිට කිසිදු හේතුවක් නොදක්වා R 5 ලේඛනය මගින් එය අහිමි කළ බවත්ය. තවද ඒ පිළිබඳව තමන් සමග සේවක පිරිසක් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ අතර එහිදී කම්කරු කොමසාරිස්වරයා විසින් A 2 ලේඛනය මගින් හිඟ වැටුප් වර්ධක ගෙවීමට නියම කළද මෙතෙක් එම ගෙවීම් සිදු නොකළ බැවින් මෙම නඩුව පැවරූ බවත්ය.

කෙසේ වුවද තමන් ඇතුළු සේවක පිරිසක් තම වෘත්තීය සමිතිය මගින් මෙම වැටුප් වර්ධක අහිමි කිරීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ අවස්ථාවේ කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණයේදී තමා සමඟ වැටුප් වර්ධක අහිමි කළ එක සේවකයකු වන ඩී. විමලසේන යන අයට පමණක් හිඟ වැටුප් වර්ධක ගෙවා ඇති බවද ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

තවද ඩී. විමලසේන යන අය ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂියට කැඳවා ඇති අතර ඔහුගේ සාක්ෂියේදී තමන්ට වැටුප් වර්ධක සියල්ල ගෙවා ඇති බව පිළිගෙන ඇත. මේ පිළිබඳව වග උත්තරකාර පාර්ශ්වය හරස් ප්‍රශ්න විමසීමේදී හෝ හබකර නොමැත.

තවද R 5 ලේඛනය මගින් වැටුප් වර්ධක ගෙවීම දෝෂ සහගත වී නම් මෙම පැමිණිල්ල කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කළ අවස්ථාවේදී පැමිණිලිකාර එක් සේවකයකුට පමණක් මෙම නඩුවේ පැමිණිලිකරුගේ සාක්ෂියේදී සඳහන් කර ඇති පරිදි "ඩී. විමලසේන " නැමැති සේවකයාට පමණක් මෙම නොගෙවූ වැටුප් වර්ධක හිඟයන් නැවත ගෙවීම නීතිය ඉදිරියේ සමානයන් අතර අසමාන ලෙස සැලකීමක් වන බව තීරණය කරමි.

05 තවද මෙම වැටුප් වර්ධක වැඩිවීමට අදාළව හිඟ වැටුප් නොගෙවීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණිලි කල බවත්, කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා එකී හිඟ ගෙවීම් කිරීමට නියම කර ඇති බවත් දෙපාර්ශ්වයම පිළිගෙන ඇත. කෙසේ වුවද වග උත්තරකාර පාර්ශවය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී සහ සිය ලිඛිත කරුණු සැලකිරීමෙහිද සඳහන් කර ඇත්තේ එය කම්කරු කොමසාරිස්වරාගේ නියෝගයක් නොව දැන්වීමක් හෝ නිර්දේශයක් පමණක් බවයි.

කෙසේ වුවද කොමසාරිස්වරයාගේ දැන්වීම හෝ නිර්දේශය ක්‍රියාත්මක කිරීම වග උත්තරකාර පාර්ශ්වය විසින් පැහැර හැරීමෙන් ඉල්ලුම්කාර පාර්ශ්වයට දැඩි අගතියක් සිදුව ඇති බව නිගමනය කරමි.

06 2022.12.21 දින වග උත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබාදීම සඳහා ප්‍රාදේශීය මුදල් කළමනාකාර කුමාරි තෙන්නකෝන් මහත්මිය පෙනී සිටි අතර සාක්ෂිකාරිය සිය මූලික සාක්ෂියේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ විශේෂ වැටුප් වර්ධකය යනු ප්‍රසාද වැටුප් වර්ධකයක් බවත්, එය කළමනාකරණයේ අභිමතය හෝ ප්‍රතිපත්තිමය තීරණය මත ආයතනයේ බොහෝ පිරිසකට ගෙවූ බවයි. සාක්ෂිකාරිය විසින් සාක්ෂි දෙමින් සාමාන්‍ය සහ විශේෂ වැටුප් වර්ධක අතර වෙනස පැහැදිලිකර ඇති අතර ඒ බව පහත පරිදි ප්‍රකාශ කර ඇත.

ප්‍රශ්නය : පැහැදිලි කරන්න.

පිළිතුර : සාමාන්‍ය වැටුප් වර්ධකයක් සේවකයකුට සේවකයාගේ පැමිණීම වැනි කරුණු මුල් කරගෙන වාර්ෂිකව දෙනු ලබන වැටුප් වර්ධකයක්. විශේෂ වැටුප් වර්ධකයක් කියන්නේ ප්‍රසාදයක් වශයෙන් දෙනු ලබන වැටුප් වර්ධකයක් කිවොත් නිවැරදියිද?

ප්‍රශ්නය : මේ විශේෂ වැටුප් වර්ධක කියන්නේ ආයතනයේ කළමනාකාරිත්වයේ අභිමතය හෝ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගෙවන වැටුප් වර්ධකයක් කීවොත් නිවැරදිද?

උත්තරය : ඔව්

වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකාරියගේ මෙම සාක්ෂියෙන් තහවුරු වන්නේ මෙම වැටුප් වර්ධක ප්‍රසාද වැටුප් වර්ධකයක් වශයෙන් ලබාදී ඇති බවත්, එය කළමනාරිත්වයේ අභිමතය හෝ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගෙවූ බවත්ය. මේ අනුව පැමිණිලිකරුට ගෙවූ විශේෂ වැටුප් වර්ධකය ප්‍රසාද වැටුපක් ලෙස ගෙවූ බව තහවුරු වන අතර කිසිදු පදනමකින් තොරව නීතියෙන් පිටස්තරව වැරදි ලෙස ගෙවූ වැටුප් වර්ධකයක් ලෙසට ගෙන එනු ලබන තර්කය මෙහිදී බිඳ වැටේ. තවද සාක්ෂිකාරිය වැඩි දුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ R 5 ලේඛනය මගින් වැටුප් අහිමිකර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි සිදුකළ බවයි. කෙසේ වුවද R 5 ලේඛනය කළමනාකාර අධ්‍යක්ෂකගේ උපදෙස් මත නිකුත් කළ බවට එම ලේඛනයේ සටහන් වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත නිකුත් කල ලේඛනයක් බව තහවුරු කිරීමට සාක්ෂිකාරිය අසමත්ව ඇත. ඒ අනුව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදී වැටුප් වර්ධකයේ හිමිකම යම් පදනමක් මත ලබාදී ඇති අතර එය නිශ්චිත හේතුවක් නොදක්වා කළමනාකාර අධ්‍යක්ෂවරයා තම අභිමතය පරිදි යම් කාලයකට අහිමි කිරීම නීත්‍යානුකූල නොවන බව තීරණය කරමි.

07. 2023.06.16 දින වග උත්තරකාර ආයතනයේ සහකාර මානව සම්පත් කළමනාකාර යමුනා දහනායක මහත්මිය වග උත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවා ඇති අතර, ඇයගේ සාක්ෂියේදී මෙම වැටුප් වර්ධක ලබාදීම දේශපාලන හේතු මත සිදුවූවක් බව ඒත්තු ගැන්වීමට උත්සහ ගෙන ඇත.

ප්‍රශ්නය : මහත්මිය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ට වාර්ෂික නොවන වැටුප් වර්ධකයක් ලබාගැනීමට අයිතිවාසිකමක් තිබෙනවාද?

උත්තරය : අයිතිවාසිකමක් නෙවෙයි. දේශපාලන වශයෙන් දීලා තියෙන වැටුප් වර්ධකයක් විදියට තමයි මේක සලකන්නේ යනුවෙන් ප්‍රකාශ කර ඇත. (2023.06.16 සාක්ෂි සටහන් පිටු අංක 3) කෙසේවුවද මෙම වැටුප් වර්ධක දේශපාලන බලපෑම් මත ලබාදුන්නේ කෙසේද යන්න තහවුරු කිරීමට සාක්ෂිකාරිය අපොහොසත්ව ඇත.

තවද 2022.12.21 දින වග උත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබා දීම සඳහා ප්‍රාදේශීය මුදල් කළමනාකාර කුමාරි තෙන්නකෝන් මහත්මිය පෙනී සිටි අතර සාක්ෂිකාරිය සිය මූලික සාක්ෂියේදී සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ විශේෂ වැටුප් වර්ධකය යනු ප්‍රසාද වැටුප් වර්ධකයක් බවයි. ඒ අනුවද වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුවන් දෙදෙනාගේ සාක්ෂි අතර පරස්පර විරෝධී බවක් දක්නට ඇත.

කෙසේ වුවද වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකාර යමුනා දසනායක මහත්මියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී ඇය ප්‍රකාශ කර ඇත්තේ 2017 වසරෙහි මෙම වැටුප් වර්ධක නැවත ගෙවීමට තීරණය කර ඇත්තේ එය නීත්‍යානුකූල නිසාද යන්න විමසා ඇති අතර, ඇය ප්‍රකාශ කර ඇත්තේ සේවක ඉල්ලීම් මත පිළි අරගෙන තිබෙනවා මෙය ගෙවන්න කියලා යනුවෙනි.

ප්‍රශ්නය : එහෙම ගෙවන්නේ මේ වැටුප් වර්ධක නිත්‍යානුකූල නිසා නේද?

උත්තරය : සේවක ඉල්ලීම් මත පිළිඅරගෙන තිබෙනවා මේක ගෙවන්න කියලා යනුවෙන් ප්‍රකාශ කර ඇත. (2023.06.16 සාක්ෂි සටහන් පිටු අංක 13) මේ අනුව A 1 ලේඛනය මගින් ලබාදී ඇති විශේෂ වැටුප් වර්ධක නීත්‍යානුකූල බව සාක්ෂිකාරියගේ සාක්ෂියෙන් තහවුරු වී ඇත.

08. තවද මෙම විශේෂ වැටුප් වර්ධක 2017 වර්ෂයේ ජනවාරි මස සිට නැවත ගෙවීම වග උත්තරකාර ආයතනය විසින් සිදුකරමින් පවතී. ඒ අනුව ද පෙනී යන්නේ මෙම විශේෂ වැටුප් වර්ධක ගෙවීම් නීත්‍යානුකූල වන බව වග උත්තරකාර ආයතනය විසින් තම ක්‍රියාවන් තුළින්ම පිළිගෙන ඇති බවයි.

**ප්‍රදානය**

01 මෙම පැමිණිල්ලට අදාළ විශේෂ වැටුප් වර්ධක ගෙවීම ඉහත සාක්ෂි මත නීත්‍යානුකූල බව තහවුරු වන අතර, වග උත්තරකාර පාර්ශ්වය විසින් 2004 මැයි සිට 2017 ජනවාරි දක්වා කාලයට අදාළ විශේෂ වැටුප් වර්ධක පිළිබඳ හිඟය පැමිණිලිකරුට නොගෙවීම යුක්ති සහගත සහ සාධාරණ නොවන බව තීරණය කරමි.

02 ඒ අනුව ඉහත කී කාලයට අදාළව පැමිණිලිකරුට ගෙවිය යුතු විශේෂ වැටුප් වර්ධක හිඟ ගෙවීම වන රුපියල් හැටනව දහස් එකසිය දහයක මුදල (රු. 69110/=) පැමිණිලිකරුට ගෙවීමට වග උත්තරකරුට නියෝග කරමි. (2022 මාර්තු 30 දින ඉල්ලුම්කරු විසින් වග උත්තරකරුවන්ටද පිටපතක් සහිතව ගෙවිය යුතු වැටුප් වර්ධක මුලු හිඟය රු. 69110/=ක් ලෙස ගණනය කර ඉදිරිපත් කර ඇත.) එකී මුදල ඉල්ලුම්කරුට ලබාගත හැකිවන පරිදි මෙම ප්‍රදානය *ගැසට්* කර මසක් ඇතුළත මහනුවර දකුණ කම්කරු කාර්යාලයේ තැන්පත් කරන මෙන්ද වැඩිදුරටත් නියෝග කරමි.

03 ඉහත නියෝගය යුක්ති සහගත සහ සාධාරණ නියෝගයක් බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

එච්.එම්. අනුලාවතී,
බේරුම්කරු.

2024 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0018

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.